# ප්‍රචණ්ඩ ගැටුමින් පසු

# සමගි සන්ධානය (සමගි වීමට එකඟ වීම)

## සංක්ෂිප්ත ප්‍රතිපත්ති විග්‍රහයක්

© ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරණ සහාය සඳහා වූ ජාත්‍යන්තර ආයතනය 2004 (IDEA)

ජාත්‍යන්තර IDEA ප්‍රකාශන නිශ්චිත ජාතික හෝ දේශපාලනික අවශ්‍යතා මත පළවූවන් නොවේ. මෙම ප්‍රකාශනයෙහි පළකර තිබෙන අදහස්වලින් සැමවිටම ජාත්‍යන්තර IDEA ආයතනයෙහි හෝ එහි පාලක මණ්ඩලයෙහි හෝ එහි සාමාජිකයින්ගේ මතය පිළිබිඹු නොවේ.

මෙම ප්‍රකාශනයෙහි අඩංගු සියල්ල හෝ ඉන් කොටසක් නැවත පළකිරීම හෝ පරිවර්තනය කිරීම සඳහා පහත සඳහන් ලිපිනයෙන් අවසර ලබාගත යුතුය.
තොරතුරු අංශය
ජාත්‍යන්තර IDEA
SE - 103 34 ස්ටොක්හෝම්
ස්වීඩනය.

මෙම ආයතනයෙහි වැඩ කටයුතු හා සේවාවන් ප්‍රසිද්ධියට පත්කිරීම සඳහා අනුබල දෙන අතර, එහි ප්‍රකාශන පරිවර්තනය කිරීමට හෝ පළකිරීමට කෙරෙන සෑම ඉල්ලීමක් සඳහාම ක්‍ෂණිකව ප්‍රතිචාර දක්වනු ලැබේ.

ග්‍රැෆික් සැලැස්ම : ස්ලෝ ෆෝක්ස් ප්‍රොඩක්ෂන්ස්, AB, ස්වීඩනය.
ආවරණ ඡායාරූප : CORBIS/ SCANPIX
මුද්‍රණය:
ISBN : 91-89578-08-2

මෙය ස්වීඩනයේ, ස්ටෝක්හෝම්හි ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරණය සහාය සඳහාවූ ජාත්‍යන්තර ආයතනයේ (IDEA), "ප්‍රචණ්ඩ ගැටුමෙන් පසු සමාදානය" යන ග්‍රන්ථයෙහි සෘජු පරිවර්තනයකි (ISBN-91-89098-87- 0).

මෙම පරිවර්තනයෙහි නිරවද්‍යතාවය පිළිබඳව ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරණ සහාය සඳහා වූ ජාත්‍යන්තර ආයතනය පිරික්සා බලා නැත. යම් සැකයක් මතුවුවහොත්, මුල් ඉංග්‍රීසි පිටපත පිළිගත යුතුය.

CPA
Centre for Policy Alternatives

මෙම පරිවර්තනය භාරකාරත්වය :
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය,
නො. 24/2, 28 වැනි පටුමග,
මල් පාර, කොළඹ - 07,
ශ්‍රී ලංකාව.

# ප්‍රචණ්ඩ ගැටුමින් පසු සමගි සන්ධානය (සමගි වීමට එකඟ වීම)

## සංක්ෂිප්ත ප්‍රතිපත්ති විග්‍රහයක්

*මෙම සංක්ෂිප්ත ප්‍රතිපත්ති විග්‍රහය IDEA ප්‍රකාශනයක් වන **"ප්‍රචණ්ඩ ගැටුමෙන් පසු සමගි සන්ධානය: අත්පොතක්** (2003) හි සාරාංශ ගත කිරීමකි. නිදර්ශන හා සිද්ධි අධ්‍යයනය ඉවත් කොට තහවුරු කිරීමේ තර්ක කෙටි කරන ලදි. මෙහි ඇත්තේ එම අත්පොතෙහි හරය පමණි. අතීත ප්‍රචණ්ඩත්වයේ උරුමය විසඳීමට උචිත ක්‍රියාවලියක් සැලසුම් කිරීම සඳහා ප්‍රතිපත්ති ගොඩ නැගීමේ මූලික කරුණු සාරාංශයක් පමණි.*

හැඳින්වීම

## සමගි සන්ධානය හා ප්‍රජාතන්ත්‍රවාදය

**ප්‍රජාතාන්ත්‍රික සමගි සම්මුතිය ගැටුමේ හේතු කාරණා වලට විසඳුම් සපයන අතර, සමගි සන්ධානය එම විසඳුම් ක්‍රියාත්මක කල යුතු අය අතර සම්බන්ධතාවය පිළිබඳව යොමු වේ.**

ඵලදායි පශ්චාත් ගැටුම් ප්‍රජාතන්ත්‍රවාදයක් ගොඩ නැගෙන්නේ ද්විත්ව පදනමක් මතය. එනම් සමාජයක් බෙදෙන කරුණු සාමකාමීව නිරාකරණය කෙරෙන සාධාරණ ව්‍යුහයක් හා ක්‍රියා පටිපාටි සමූහයකින් හා ඊට හවුල් වන කණ්ඩායම් අතර ක්‍රියාකාරී සම්බන්ධතා සමූහයකිනි. ව්‍යුහයන් සාධාරණ නොවන්නේ නම්, සමාජයක මෙම ක්‍රියාකාරී සම්බන්ධතා ගොඩ නැගෙන්නේ නැත. අනෙක් අතට, සමාජයේ පුරවැසියන් අතර අන්තර් සම්බන්ධතාවලට අවම සහයෝගයක් නොමැති නම්, එම ව්‍යුහයන් කෙතරම් සාධාරණ වුව ද නිසි පරිදි ක්‍රියා නොකරනු ඇත.

ප්‍රජාතාන්ත්‍රික සමගි සම්මුතිය, ගැටුමේ හේතු කාරණා වලට විසඳුම් සපයන අතර, සමගි සන්ධානය එම විසඳුම් ක්‍රියාත්මක කළ යුතු අය අතර සම්බන්ධතාවය පිළිබඳව යොමු වේ. මෙය අදාළ වන්නේ හුදෙක් දේශපාලනඥයන්ට පමණක් නොව සමගි සම්මුතියෙහි නිරතව කටයුතු කරන්නන්ට ද වේ. මෙය සමස්ත ජනතාවට අදාල වේ. ලෝකයේ දක්ෂ ප්‍රජාතාන්ත්‍රිකයන් විසින් ඉදිරිපත් කරන ලද ඉතා උසස් ප්‍රජාතාන්ත්‍රික ක්‍රම, අදාළ ජනතාවට අවම වශයෙන් හෝ විශ්වාස කළ හැකි ලෙස සකස් වී නොමැති නම් හෝ එකිනෙකා විශ්වාසය තබන්නේ නැති නම් හෝ එය උරගා බලන්නට හෝ සූදානම් නැති නම් පැවතීමක් නැත.

සමගි සන්ධානය, ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාකාරී සම්බන්ධතා වර්ධනය කිරීම මගින් එහි පදනම ශක්තිමත් කරයි. එමෙන්ම සමගි සන්ධානයට ආර්ථිකමය සාධාරණත්වය, දේශපාලන හා සාමාජීය බලය බෙදා ගැනීම

යනාදි වූ ප්‍රජාතාන්ත්‍රික සහායන් අවශ්‍යය. සමගි සන්ධානය සඳහා සදාචාරමය තර්ක මෙන්ම බලවත් ප්‍රායෝගික තර්ක පවතින විට ඇති වන ධනාත්මක ක්‍රියාකාරී සම්බන්ධතා විසින් යහපත් පාලනයක් ව්‍යාප්ත කළ හැකි වාතාවරණයක් උත්පාදනය කරවන අතර ඍණාත්මක ක්‍රියාකාරී සම්බන්ධතා ඉතා හොඳ පාලන ක්‍රම වුව ද යටපත් කිරීමට හේතු වේ.

## 1 සමගි සන්ධානය : පොදු ප්‍රතිපත්ති කරුණු

**සමගි සන්ධානය යනු, භින්න අතීතයකින්, සහභාගිත්ව අනාගතයක් සඳහා යෑමේදී අදාල සත්‍යය, සමථයකට පත් වීම, ප්‍රකෘතිමත් කිරීම යන මූලික මෙවලම් ඇතුලත් අති සාධන ක්‍රියාවලියකි.**

සමගි සන්ධානය යනු අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ අරමුණු සපුරා ගැනීමේ ක්‍රියාවලියක් ද වේ. මෙම කරුණු දෙක පටලවා ගැනීමෙන් මතභේද ඇතිවිය හැකිය. අප සමගි සන්ධානය අවධානය කරන්නේ ක්‍රියාවලියක් ලෙසිනි. අපගේ අරමුණ/අදහස සඳහා සමගි සන්ධානය යනු සමාජයක් බෙදුණු අතීතයකින් හවුල්කාර අනාගතයක් කරා යෑමේදී යුක්තිය, සත්‍යය, වැරදි හරි ගස්සා ගැනීම යනාදී වශයෙන් වූ මූලික ලක්ෂණ ඇතුළත් වන සමස්ත ක්‍රියාවලියකි.

- ***සමගි සන්ධානය යනු දීර්ඝ කාලීන ක්‍රියාවලියකි.*** සමගි සන්ධානය සඳහා ඉක්මන් ස්ථාපිත බවක් නොමැත. ඊට ඒ සඳහාම වූ කාලයක් ඇත. සාමය සඳහා අණ දිය නොහැකිය.
- ***සමගි සන්ධානය යනු ගැඹුරු ක්‍රියාවලියකි.*** ඊට ආකල්ප, අභිලාෂයන් සිතුම් පැතුම් හා හැඟීම්වල මෙන්ම ඇතැම් විට විශ්වාසයන්ගේත් වෙනසක් අවශ්‍ය වේ. එවැනි දැඩි වෙනසක් කලබලයෙන් හෝ පැනවීමකින් කළ නොහැකිය.
- ***සමගි සන්ධානය යනු ගැඹුරු ක්‍රියාවලියකි.*** එය සෑම කෙනෙකුටම අදාළ වේ. එය ඍජුවම පීඩාවට පත් වූ අය හා පීඩාවෙන් පරාජයට පත් වූ අය සඳහාම පමණක් නොවේ. ප්‍රචණ්ඩ ගැටුම් ශක්තිමත් කරන ආකල්ප හා විශ්වාසයන් සමාන්‍යයෙන් මුළු ප්‍රජාව පුරාම පැතිර පවතින්නක් බැවින් පුළුල් මට්ටමකින් ඇමතිය යුතුය.
- ***සාර්ථකත්වය සඳහා එක් වට්ටෝරුවක් නොමැත.*** සෑම ගැටුමක් හා එය ප්‍රජාතාන්ත්‍රිකව විසඳුමකට එළඹීමේ ආකාරයන් ද වෙනස් ය. එපමණට සම්බන්ධ සමගි සන්ධාන ක්‍රියාවලිය සියළු වැදගත් අනෙක් අංගයන් බොහෝ සමානතාවයන් ඔවුන් සමග බෙදා ගත්ත ද ඒවායින් වෙනස් වේ.
- ***ප්‍රදාන සපයන ප්‍රජාවන් සමගි සන්ධානය සඳහා උදවු වීමට වැඩි සූදානමකින් සිටිති.*** ද්විපාර්ශවික හා බහු පාර්ශ්විය ප්‍රදානකයින් මෙන්ම බහු පාර්ශවීය හා කලාපීය ක්‍රියාකාරීන් ගැටුම් වැළැක්වීම, මානව සංවර්ධනය, මානව ආරක්ෂාව, දරිද්‍රතාවය තුරන් කිරීම හා සාමය ගොඩ නැගීමේ උප අංගයක් ලෙස සමාදානයේ වැදගත්කම අවබෝධ කර ගනිමින් සිටී.

## 2 සමගි සන්ධාන ක්‍රියාවලිය

සමගි සන්ධාන ක්‍රියාවලිය තර්කානුකූල අවධීන් ගණනාවකට සරල කිරීමේ අනතුරක් ද පවතී. අවධීන් හැම විටම අනු පිලිවෙලක් අනුව ගමන් ගන්නේ නැත. එසේ වුවත් ඒවා ස්ථිරසාර සමගි සන්ධානයක අත්‍යවශ්‍ය අංගෝපාංග ලෙස පවති.

### *01 අවධිය* : බිය වෙනුවට අවිහිංසා සහජීවනය ආදේශ කිරීම.

වෙඩි හඬ නතර වූ පසු එදිරිවාදිකම් වලින් බැහැර වීමේ ප්‍රථම පියවර වනුයේ අවිහිංසා

සහජීවනයයි. එය අවම අර්ථ නිරූපණයට අනුව ජීවත්වීම හා ජීවත්වීමට ඉඩ දීමත්, බෙදීම් තුළින් මූලික සන්නිවේදනය නැවත ඇරඹීමක් සේ හැඳින්විය හැක. දේශපාලන හා ප්‍රජානායකයන් රාජ්‍ය නොවන සංවිධාන සහ ආගමික ආයතනත්, එවැනි සන්නිවේදන ප්‍රවර්ධනය කළ යුතුය. අවශ්‍ය අවම ශාරීරික ආරක්ෂාව සහතික කිරීමේ වගකීම ජාතික සහ/හෝ අන්තර්ජාතික දේශපාලන තීරණ ගන්නන් සතුය.

### *02 අවධිය* : ආත්ම විශ්වාසය හා විශ්වාසය ගොඩ නැගීම

මේ සඳහා විපතට පත් අයත් විපත පැමිණ වූ අයත් තම තමන් කෙරේත් එකිනෙකා කෙරේත් නව විශ්වාසයක් ගොඩ නගා ගැනීම අවශ්‍ය වේ. එමෙන්ම අනෙක් අයගේ මිනිස්කම පිළිගත යුතුය. අන්‍යෝන්‍ය විශ්වාසයේ පදනම වන්නේ එයයි. මෙම අවධියේත් විපතට පත් අය තමන්ට එය සිදු කළ අයගේ වගකීමේ මට්ටම, පුද්ගලයින් හා සමස්ථ ප්‍රජාව අතර ඇති වෙනස හඳුනා ගැනීමට පටන් ගනී. ඒ තුළින් ප්‍රතිවාදී කණ්ඩායමේ සියලු සාමාජිකයන් සැබවින්ම හෝ වරදකරුවන් වියහැකි යැයි පෙර ජීවිත රටාවට අභියෝග කෙරේ. විශ්වාසය ගොඩනැගීම සඳහා පූර්ව අවශ්‍යතාවයන් වනුයේ ශාරීරික ආරක්ෂාව, ප්‍රචණ්ඩත්වය නොමැතිවීම හා දේශපාලන වර්ධනයන්හි ආරම්භය යනාදියයි.

### *03 අවධිය* : පසුතැවීමක් කරා

පසුතැවීමක් ඇති වනුයේ විපතට පත් අය තමන්ට දුක ගෙන දුන් අයට ඇහුම්කම් දීමට කැමති වීමෙන් හා එම දුක පැමිණ වූ අය ඉන් විඩාවට පත් අයගේ වේදනාව පිළිගැනීමෙනි. සත්‍යය පැවසීම සමගි සන්ධානයේ පූර්ව කොන්දේසියකි. එමගින් මිනිසුන්ට එකට දුක බෙදා ගැනීමෙන් හා සාමූහික වගකීමෙන් අතීතය දෙස බැලීමට නිශ්චිත අවස්ථාවන් නිර්මාණය වේ.

එහෙත් දේශපාලන, නෛතික හා ආර්ථිකමය ව්‍යුහාත්මක අයුක්තිය පවතින්නේ නම් සාමාකාමී සහජීවනය විශ්වාසය හා පසුතැවීම කල් පවත්නා ආකාරයෙන් වර්ධනය වන්නේ නැත. එම නිසා සමගි සන්ධාන ක්‍රියාවලියට, ක්‍රමානුකූලව බලය බෙදා ගැනීම, එකිනෙකාගේ දේශපාලන බැඳීම් වලට ගරු කිරීම, මානව අයිතිවාසිකම් රැකීමට හා ආර්ථික සාධාරණත්වයක් සඳහා සුදුසු වාතාවරණයක් පැවතීම හා අතීතයට මෙන්ම අනාගතය සඳහා ද සාමූහික වගකීම පිළිගැනීමට කැමැත්ත යනාදිය තුළින් සමගි සන්ධාන ක්‍රියාවලියට සහාය විය යුතුය.

## සමගි සන්ධානය ක්‍රියාවලියේ හිමිකාරත්වය/ අයිතිය

සාමාන්‍යයෙන් අධිකාරීන් සමගි සන්ධාන ක්‍රියාවලිය අරඹන්නේ ඉහළ සිට පහළට හෝ පහළ සිට ඉහළට වන ප්‍රවේශයකිනි. පහළ සිට ඉහළට ප්‍රවේශය අවධාරණය යොමු කරන්නේ සාමාජිකයන් අතර අන්තර්-පුද්ගල සම්බන්ධතාවයන් කෙරේය. දේශීය හා ඔවුන්ටම ආවේණික වූ සමගි සන්ධානය හා පහළ මට්ටමේ මුල පිරුම් සාර්ථකත්වයට මූලික සේ ගැනේ. ඉහළ සිට පහළට ප්‍රවේශයේ ජාතික මට්ටමේ කාර්යයන් ප්‍රමුඛතා ගත කරන අතර ඒවා ප්‍රාදේශීය මට්ටමේ වෙනස්කම් හා දිරිගැන්වීම් නිර්මාණය කිරීම සඳහා යොමු වේ. පහළ සිට ඉහළටත් ඉහළ සිට පහළටත් යන ක්‍රියාවලීන් දෙකම එකිනෙකා හා තරහ කිරීමට වඩා සුහවාදී වීම අත්‍යවශ්‍යය. අන්තර් ජාතික ප්‍රජාවට ද වැදගත් භූමිකාවක් හිමි වුව ද එය සංයමයෙන් ආරක්ෂාකාරී ප්‍රවේශයක් විය යුතු ය. කල් පවත්නා සාමය තමා තුළම ජනිත විය යුතුය. එසේ වුවත් අන්තර් ජාතික ප්‍රජාවට දේශීය සමගි සන්ධාන වැඩසටහන්වලට ආධාර දීමෙන්, අධීක්ෂණයෙන්, උපදෙස් විශේෂඥතාවය හා පුහුණුව ලබා දීමෙන් ද ද්‍රව්‍යාත්මක සම්පත් සැපයීමෙන් ද සහය විය හැකි ය.

## කාල නිර්ණය

**සමගි සන්ධානය දැන් ගැටුම් වැළැක්වීමේ තීරණාත්මක පැතිමානයක් සේ පැහැදිලිවම හඳුනා ගනී.**

සමගි සන්ධානය සඳහා සුදුසු වේලාව කුමක් ද? මෙම අසීරු තීරණය ගැනීමේදී ප්‍රතිපත්ති සම්පාදකයින් පහත සඳහන් නිර්දේශ සලකා බැලිය යුතුය.


- ***දේශපාලන ප්‍රමුඛතා නිසා සමගි සන්ධානය වීම අතපසු නොකරන්න.*** සංක්‍රාන්ති කාල පරිච්ඡේදයේ ඇති කදබදය නිසා බොහෝ විට සමගි සන්ධානය වෙනුවට දේශපාලනය හා ආර්ථිකය ව්‍යුහයන් ස්ථාපනය කිරීමෙන් හෝ සමාදානයවීමේ න්‍යාය පත්‍රය ගිලිහී යාමට සැලැස්වීමෙන් සමගි සන්ධානය වීමේ දීර්ඝ කාලීන ඉඩ ප්‍රස්ථා වලට හානි නොකිරීමට වගබලා ගත යුතුය. කතා නොකරන ලද වේදනාත්මක තත්ත්වයන් පුළුල්ව හා අසාධාරණකම් අසහනයට හා වර්ධනය වීමෙන් අවසානයේදී ඉතා හොඳ දේශපාලන හෝ ආර්ථික ප්‍රතිශෝධන පවා යටපත් කරනු ඇත. පවතින තත්ත්වය නිසා ඉක්මණින්ම කළ නොහැකි නම් අවම වශයෙන් අන්තර්වාර සමගි සන්ධාන පියවර පිළිගත යුතුය.
- ***දීර්ඝ කාලීන දැක්මක් ඇතිව වැඩ කරන්න.*** කෙටි කාලීනව හා මධ්‍ය කාලීනව කෙතරම් සාර්ථක වුව ද සමගි සන්ධානය වීම දීර්ඝ කාලීන පරම්පරා ගණනාවක් දිගට විහිදෙන ක්‍රියාවලියක් සේ පිළිගත යුතුය. මේ සම්බන්ධයෙන් වන තීරණාත්මක මාර්ගයන් තුනක් ඇත. අධ්‍යාපනය (ගැටුම් හා ඒවා විසඳා ගැනීම, අවබෝධ කර ගැනීම, ප්‍රවර්ධනය කිරීම, අත්දැකීම්වල විවිධත්වය වාර්ගිකත්වය, ආගම හා දේශපාලන මතයන් යනාදිය ඉවසීම) සිහිපත් කිරීම් (නිදසුන් වශයෙන් විපතට පත් වුවන් සිහිපත් කිරීම සඳහා ස්ථිර සිහිවටනයන් සිහිපත් කිරීමේ ස්ථාන, සිහිපත් කිරීමේ දින, නාට්‍ය, කවි, පෞද්ගලික වේදනාවට සාමූහික පැතිමානයක් ලබා දෙන දේ හා දිගු කාලීනව සුවපත් වීමේ යාන්ත්‍රණයක්) හා අතීතය ගැන සමාව අයැදීම (වෙනසකට ඇති කැප වීමත් වගකීමත් අවංකව පිළි ගැනීම ඇතුළුව)
- කාලය තුළින් පමණක් සමගි සන්ධානය ඇති නොවන බව පිළිබඳව දැනුවත්ව සිටින්න. සමගි සන්ධානයෙහි අත්‍යවශ්‍ය අවධීන් වන සත්‍යය සඳහා සෙවීම, යුක්තිය හා හානි ප්‍රතිපූර්ණය කාලයත් සමග ඉබේම අමතක නොවේ. විසඳුම් නොමැති ප්‍රචණ්ඩ අතීතයක් අළු යට සැඟවුණු ගිනි පුපුරක් මෙනි.

## 3 සමගි සන්ධානය වීමේ සන්දර්භය

**බෙදීම් හරහා යන ස්වයං ඇල්ම/උනන්දුව සමගි සන්ධානය ඇති කිරීම පහසු කරවීමට ප්‍රබල ලෙස කාර්යක්ෂම විය හැකිය.**

විශේෂිත සන්දර්භයක් හා බැඳෙන අත්‍යවශ්‍ය සාධක කල් ඇති දැක්විය නොහැකි වුවත් ඊට පහත සඳහන් කරුණුත් ඇතුළු වනු ඇත.

- ***අතීතයේ උරුමය.*** සමගි සන්ධානය වීමේ ක්‍රියාවලියක් ඉතිහාසයේ කෙතෙක් දුරට යා යුතු ද? ජීවී අතීතය යථාර්ථවාදී සීමාවක් ද? ඓතිහාසික වැරදි නිවැරදි කළ යුතු ද? කළ හැකි ද? සමාජ ඉතිහාසයේ නොයෙකුත් සංකීර්ණ තල සැලකිල්ලට ගැනීමේදී යථාර්ථවාදී සමබරතාවයක් ඊකගත යුතුය.
- ***අතීත ප්‍රචණ්ඩත්වයේ තීව්‍රතාවය*** ඊට සම්බන්ධ අයගේ ප්‍රතිචාරයේ ගැඹුර




සෘජුවම බලපාන අතර එතුළින් යොමුවිය යුතු ප්‍රශ්ණයේ පරිමාණය අර්ධ වශයෙන් ඉදිරිපත් කරයි. තීව්‍රතාවය සමගි සන්ධානයෙහි ශුභවාදී හා අශුභවාදී වීමේ ප්‍රමාණය වගේම ජනතාවගේ අවබෝධයේ අවශ්‍යතාවය පෙන්වයි.

- ***භෞතික විනාශයේ ප්‍රමාණය,*** සමගි සන්ධානය වීමේ (හෝ වෙනත් ඕනෑම) මුල පිරුමක් සඳහා වු මෙහෙයුම් හා සම්පත් ධාරිතාවන් රඳා පවතින්නේ රටේ වත්මන් හා අනාගත ආර්ථික තත්ත්වය මතය. සැලසුම්, යථාර්ථවාදී, කළ හැකි හා ලබා දිය හැකි ඒවා විය යුතුය.

- ***දේශපාලන පරිවර්තනයේ අකාරය*** මර්ධනකාරි රජයක් ප්‍රචණ්ඩකාරීව සම්පූර්ණයෙන් පෙරළා දමු විට හෝ තීරණාත්මක ජයග්‍රහණයකින් සිවිල් යුද්ධයක් අවසන් වු විට එකටෙක කිරීම සඳහා වන දඬුවම්කාරි ව්‍යුහයන් ඇති කිරීමේ ප්‍රවනතාවයක් විය හැකි පැරණි පාලනය තුළ සිටි හා දනට බලයේ සිටින අය තුළ ප්‍රතිශෝධන ගෙන ඒම හා ක්‍රියාත්මක වීම සිදුවන විට හා පැරණි පාලනය අවසන් කිරීමේ මුල පිරුම හා තීරණාත්මක කොටසක් ඉටු කරන විට ක්‍ෂමාව දීමේ සවයං ආරක්‍ෂාව දිරිමත් කෙරෙනු ඇත. ඒකාබද්ධ සාකච්ඡා කිරීමක් තුළින් පරිවර්තනය සිදුවන විට සමානයන් අතර සාකච්ඡා කිරීමක් තුළින් ක්‍රියාවලීයක් ගොඩනගා ගත හැකි වනු ඇත. අවසාන වශයෙන් පරිවර්තනයෙන් නව සර්ව බලධාරි පාලනයක් ඇති වුවහොත් එය සමගි සන්ධානය වීමේ ක්‍රියාවලියට ද බලපෑ හැක. නව රජයට සමගි සන්ධානය සඳහා බල කිරීමටත්, පැරණි බලවතුන්ට තම ක්‍රියාවන් වෙනුවෙන් අධිකරණමය දඬුවම පිළිගන්නා ලෙසත් බල කළ හැකි වනු ඇත. එසේ වුවත් ඉන් පැරණි බලවතුන් තුළ ඔවුන් දන් පීඩාවට පත් වුවන්ය යන හැඟීමක් ඇති කළ හැකිය.

- ***කෙටි මාවතක් සෙවීමේ වුවමනාවන්:*** බෙදුණු දෙපාර්ශවයම තුළ ස්වයං උනන්දුවෙන් යුත් උප කාණ්ඩ සිටීම නිසා ඔවුන් ප්‍රජාවන් අතර සමගි සන්ධානයට හා සහයෝගය ඇති කිරීමට යොදා ගත හැකිය. යුද්ධයක පැටලී සිටි දෙපාර්ශ්වයේම ස්ත්‍රීන්, සමාජ බලයෙන් පිරිමින්ට සමාන කොටසක් ලබාදෙන ලෙස වඩාත් හොඳින් ඉල්ලා සිටීමට එකට එක් වනු ඇත. කම්කරු

කණ්ඩායම් සමාජයේ වඩා වැදගත් බලපෑම් කණ්ඩායමක් වනු ඇත. පුළුල් එකට එක් වූ වෙළෙඳ පොළකින් ව්‍යාපාරික කාර්මික වුවමනාවන් වඩාත් හොඳින් සැලසෙන අතර ඉන් එකිනෙකාගේ මානව මූල්‍යය හා ස්වභාවික සම්පත් ඌණ පූර්ණයක් ද වනු ඇත. දුප්පතුන්ට එකට එක් වීමෙන් වඩාත් සාධාරණ සම්පත් බෙදා ගැනීම සඳහා වන සටනට නව ශක්තියක් එකතු කර ගත හැක. මුල් බෙදීමෙන් වෙනස්ව මිනිසුන් එකට බැඳීමේ පොදු ආගමික හෝ භාෂාමය සම්බන්ධතා ද විය හැකිය.

- ***අන්තර්ජාතික ප්‍රජාව සමගි සන්ධානය පිළිබඳව විශේෂඥතාවය හා පුහුණු කටයුතු*** සඳහා විභව කොරකුරු මූලාශ්‍රයකි. ඊට අමතරව ජාත්‍යන්තර නෛතික නියෝග හා යුක්තිය සඳහා වන මූලික ගැටළු වලට බාහිර පොදු එකඟතාවය සකස් කරනු ලැබේ.

- ***සංස්කෘතිය :*** ප්‍රජාවක් ප්‍රචණ්ඩ අතීතයක් සමඟ කටයුතු කරන්නේ කෙසේ ද යන්න සිරිත් විරිත් හා සංස්කෘතිය සමග සමීපව බැඳී පවතී. විශේෂයෙන්ම සංස්කෘතිය සාමූහික මතක පද්ධතිය කෙරෙහි බලපායි. එය සමගි සන්ධානය වීමේ තමන්ගේම ක්‍රම වේදයන් සොයා ගැනීමේ පොහොසත් මූලාශ්‍රයක් ද වේ. සම්මත විසඳුම් සඳහා පිටස්තර ලෝකය දෙස යොමු වීමට පෙර තමන් තුළ පවතින මෙවලම් හා විසඳුම් දෙස යොමු කරවයි.

## 4 විපතට පත් වූවන්

සමගි සන්ධාන ක්‍රියාවලිය හදවත වන්නේ විපතට පත් වූවන්ය. එහෙත් ඔවුන් කවු ද? ඔවුන් අතර සමානතා බොහොමයක් තිබුණ ද තම අත්දැකීම් අවශ්‍යතා හා හැකියාවන්ගෙන් බොහොමයක් වෙනස් වේ. සෘජුවම විපතට පත් වූවන් ප්‍රචණ්ඩත්වයේ බලපෑමට සෘජුවම ගොදුරුවූවෝ වෙති වක්‍රව විපතට පත් වූවන් පීඩාවට පත් වන්නේ සෘජුවම විපතට පත් වූවන් හා බැඳී සිටින නිසාය. පළමු පරම්පරාවේ විපතට පත් වූවන් ඔවුන්ගේ ජීවිත කාලය තුළම ප්‍රචණ්ඩත්වයේ බලපෑමට ගොදුරු වූවෝ වෙති. කුරිරු ගැටුම්, මිනිසුන් හා ස්ත්‍රීන් කෙරේ වෙනස් ආකාරයට බලපෑම් කෙරෙනු ඇත. ඒ විපතට පත්වීම ස්ත්‍රී පුරුෂ භාවය අනුව ද වෙනස් වන හෙයිනි. විශේෂයෙන්ම සරණාගත ළමයින් හා ළමා සොල්දාදුවන් වඩාත්ම ආරක්ෂාව නැතිව විපතට පත් වූවන්ය. එක් එක් කාණ්ඩයක් සඳහා වෙනස් ආකාරයේ හෝ වෙනස් වූ සමගි සන්ධානයක් අවශ්‍ය වනු ඇත.

**විපතට පත් වූවන් නිර්වචනය කිරීම** - නිශ්චිත වශයෙන්ම විපතට පත් වූවෙක් යන්න නිර්වචනය සංකීර්ණ අංග ලක්ෂණ තුනකින් යුක්තය.

- ***සමාජ - දේශපාලන සාධක*** : නිල ආයතන විපතට පත් වූවන් නිර්වචනය කළත් බොහෝ විට දේශපාලනය. කාලය හා ආර්ථික සීමාවන් නිසා තම කොන්දේසි වල බල සීමාවෙන් බැහැරව සිටින බොහෝ දෙනෙකුගේ දුක් වේදනා ඊට අයත් වන්නේ නැත. සැබෑවටම අවධානය යොමු වන්නේ හෝ හානි ප්‍රතිපූර්ණයක් වන්නේ විපතට පත් අයගෙන් කොටසකට පමණි. දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ද විපතට පත් වූවන් නිර්වචනය කිරීමට දායක වේ. එය නිහඬ, අදෘශ්‍යමාන වූ විපතට පත් වූවන්ට හඬක් නැගීමට සහාය වුව ද ඔවුන්ගේ නිරත වීම හැම විටම මධ්‍යස්ථ නොවේ.

- ***නෛතික නිර්වචනය*** : මානව අයිතිවාසිකම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසමේ, බරපතල ලෙස මානව අයිතිවාසිකම් උල්ලංඝනය වූ විපතට පත්

වූවන්ට වන්දි ලබා ගැනීමේ අයිතිය පිළිබඳව 1999 ප්‍රකාශනයෙන් මූලික අන්තර් ජාතික නිර්වචනයක් ඉදිරිපත් කර ඇත. යුගොස්ලාවියාව හා රුවන්ඩාව පිළිබඳ අධිකරණයන් හා අන්තර් ජාතික අපරාධ අධිකරණයන් හිද විටිමත් නිර්වචන අඩංගුය. අන්තර් ජාතික මානවවාදී හා මානව අයිතිවාසිකම් පිළිබඳ නීතියත්, රජයේ සාම්ප්‍රදායික, දේශීය හා ආගමික නීතියත් සමඟ බැඳුණු පශ්චාත් ගැටුම් රාජ්‍යයක අපරාධ ව්‍යවස්ථාවන් ද සුදුසු නිර්වචනයකට බෙහෙවින් දායක වේ. ජාතික හා අන්තර් ජාතික විනිශ්චය සභාවන්හි විනිශ්චයකරුවෝ එය සිදු කළ තැනැත්තා කවු ද විපතට පත් වූවේ කවු ද යන්න විටිමත්ව තීරණය කරති.

■ ***සංස්කෘතිය :*** නිදසුනක් වශයෙන් පවුල හා ප්‍රජාවේ විෂය පථය නිර්වචනය කිරීමේදී සංස්කෘතිය චක්‍රාකාරව විපතට පත් වූවන් නිර්වචනය කරන ආකාරයට බලපෑම් කරයි.

**විපතට පත් වූවන් සංවිධානය කිරීම** : විපතට පත් වූවන් (නැවත) බල ගැන්වීම ඉතා වැදගත්ය. විපතට පත් වූවන්ගේ සංවිධාන මෙහිලා මූලික වේ. ඔවුන් බලපෑම් කිරීමේ කණ්ඩායම් ලෙසත්, ඔවුන් මහජන මතය දනුවත් කරීමටත් නීති ආධාර ලබා දීමට හා ගරුත්වය විශ්වසනීයත්වය නැවත ඇති කිරීමටත් ක්‍රියා කරනු ඇත. එහෙත් ඔවුන් වැරදිකරුවන්ට කොන්දේසි මත ක්ෂමාව දීම හෝ අනාගතය ගැන ප්‍රමාණවත් නොවන නිසා දැක්මක් අතීතයේම කොටුවීමෙන්, ඔවුන් නැවත සමාජයට ඇතුළත් කර ගැනීම වැනි සමාදානය වීමේ පියවර වලට විරුද්ධව පෙනී සිටීමෙන් බාධාවක් බවට පත්විය හැකිය.

**වෙනස් විය හැකි භූමිකා** : උදාහරණ වශයෙන් බුරුන්ඩි හා බොස්නියාවේ මෙන් විපතට පත් වූවන් හා වැරදිකරුවන් යන භූමිකා වෙනස් වීමෙන් බොහෝ විට, දීර්ඝ කාලයක් තිස්සේ විපතට පත් වූවන් ආක්‍රමණිකයින් වීමේ හා ආක්‍රමණිකයන් විපතට පත්වීමේ තත්ත්වයන් ද තිබිය හැකිය. සෑම කෙනෙක්ම විපතට පත් වූවෙක් ලෙස ගැනෙන මෙම ස්වභාවය වටහා ගත යුතුය.

**සමගි සන්ධානය වීමේ වැඩසටහන් සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී විපතට පත් අය හා වැරදිකරුවන් අතර වෙනස් වන භූමිකාව අවසානයට යොමු කිරීම ඉතා වැදගත් කාරණයකි.**

අත්දැකීම් අනුව පොදුවේ ප්‍රතිපත්ති සැලසුම්කරුවන් පහත සඳහන් කරුණු සැලකිල්ල යොමු කළ යුතුය.

■ විපතට පත් වූවන් පිළිබඳ කිසියම් නිර්වචනයක් තෝරා ගැනීමේ ඵල විපාක ගැන සැලකිලිමත් විය යුතුය.

■ තමන්ට සිදු වූයේ කුමක් ද යන්න ගැන විපතට පත් වූ අයගේම පෞද්ගලික දැක්ම සැළකිල්ලට ගන්න.

■ විවිධ අවධීන් හරහා විපතට පත් වූ කෙනෙකු යථා තත්ත්වයට පත්වීමේ මාර්ගය හැඳින ගන්න.

■ සෞඛ්‍යය, ආරක්ෂණය, අධ්‍යාපනය හා නිවාස වැනි සමස්ත ප්‍රජාවටම සෙත සැලසෙන ක්ෂේත්‍ර වල සාමූහික පියවර ගැනීමෙන් වන්දි වැඩසටහන් වලට ඇතුළත් වන බොහෝ දෙනෙකු සම්බන්ධ කර ගැනීම.

■ සරණාගතයින් ලෙස අසල්වැසි රටවල වෙසෙන විපතට පත් වූවන්ගේ අවශ්‍යතාවයන්ට සවන් දෙන්න.

# 5 වැරදිකරුවන්

වැරදිකරුවන් එසේ වූයේ ඇයි ද? කෙසේ ද? යන්න අවබෝධ කර ගැනීම ඔවුන්ට සමාව දීමම නොවුනත් ඕනෑම සමගි සන්ධානය වීමේ ප්‍රතිපත්තියක පූර්ව කොන්දේසියකි. ඔවුනගේ වැරදි, අභිප්‍රායන් හා අපරාධවල විවිධත්වය නිසාම සමගි සන්ධානය වීමේ ප්‍රතිපත්තියේත් ඊට සමාන විවිධත්වයෙන් යුත් ප්‍රවේශයක් අපේක්ෂා කරයි.

## 'මූලික' හා 'අනියම්' වැරදිකරුවන්

මූලික වැරදිකරුවන් යනු නිශ්චිත සාපරාධී ක්‍රියාවන් සම්බන්ධයෙන් නඩු පැවරිය හැකි අයයි. අනියම් වැරදිකරුවන් යනු දේශපාලන හෝ සදාචාරමය ස්වභාවයේ වැරදි කළ අයයි. එනම්,

(අ) අනෙකුත් අය කරන වරදි වල ප්‍රතිඵලයක් වශයෙන් වරප්‍රසාද ලබන අය

(ආ) නීතිය කඩ කිරීම් සිදු වන විට ක්‍රියා නොකර සිටින අය

(ඇ) චේතනාවක් නොමැතිව හානිකර ක්‍රියාවන් සිදු කරන අය

යනුවෙනි.

නිහඬ, අනියම් ප්‍රතිලාභීන් මිනිසුන් ඝාතන හෝ අයථා ක්‍රියා නැත. එහෙත් ඔව්හු රැකියා හා ආදායම්, නිවාස හෝ අධ්‍යාපනය, සමාජ තත්ත්වය හා දේශපාලන බලය වැනි හිඟ සම්පත් වෙන් කිරීමේදී ඵල ප්‍රයෝජන ලබති. බොහෝ විට පල ප්‍රයෝජන වර්තමානයටත්, අතීතයටත් දිවයයි. ඔවුන්ගේ වගකීම සමගි සන්ධානය වීමේ ක්‍රියාවලිය තුළින් විසඳිය යුතුය. නොඑසේ නම් බෙදීයාම හා සමාජ සාධාරණත්වය අත්පත් කර ගැනීමට අපහසු ඉලක්කයන් පමණක් වනු ඇත.

රැස්ව සිටින්නෝ සහ බලා සිටින්නෝ ප්‍රචණ්ඩ ක්‍රියා හමුවේ කිසිත් නොකර සිටීමෙන් ඊට හවුල් වෙති. ඔවුහු සිදු වන්නේ කුමක් ද යන්න දන සිටිති. නොඑසේ නම් කිසිත් නොදක්කා සේ නිහඬව සිටිති. සමහර විට බලා සිටින්නන් අන්තර් ජාතික ප්‍රජාවට අයත් වේ. අපරාධ අධිකරණය පෞද්ගලිකව කළ වැරදි ගැන විමසන අතර සත්‍යය සෙවීමේ කොමිසම මගින් කරනුයේ සාමූහික වැරදි දෙස බැලීමය. බොහෝ අවස්ථාවලදී ආගමික සංවිධාන අධිකරණය, වෛද්‍ය වෘත්තිය, ව්‍යාපාරිකයින් හා ජනමාධ්‍ය අඩු වශයෙන් ප්‍රතිලාභීන් හා බලා සිටින්නන් වශයෙන් මිනිසුන්ට සිදු කෙරෙන අසාධාරණයට සාමූහිකව දායක වෙති.

## වැරදිකරුවන් වර්ග කිරීම

වැරදිකරුවන් පිළිබඳ තොරතුරු සකස් කළ යුතුය. එහි පළමු පියවර වනුයේ අපරාධයේ බරපතල කම අනුව වැරදිකරුවන් වර්ග කිරීමයි. මෙය දුෂ්කර කාර්යක් විය හැකිය. ජනතාවගෙන් බහුතරයක් මානව හිමිකතම් උල්ලංඝනය කිරීම් වලට සම්බන්ධ වූවන් විය හැකිය. වාර්තා විනාශ කරන්නට ඇත. නොඑසේ නම් නව පාලනයට අවශ්‍ය සේවා පහසුකම් නොමැති වූවා විය හැකිය. වර්ග කිරීමේ නිදර්ශන කීපයක් පහත දක්වේ.

### වැරදි වර්ග කිරීම

***අන්තර් ජාතික අපරාධ*** (අන්තර් ජාතික සුරක්ෂිත භාවයට හා මානව වර්ගයාගේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අපරාධ: මේවා කිසියම් ගිවිසුමකින් හෝ දේශීය නීතියෙන් සංශෝධනය කළ නොහැකිය.)

- 1998 අන්තර් ජාතික අපරාධ අධිකරණ (ICC) නීතියෙන් (7 වැනි වගන්තිය) ***මානව වර්ගයාට එරෙහි අපරාධ*** යනුවෙන් නිර්වචනය කර ඇත්තේ සාමාන්‍ය ජනතාවගෙන් කිසියම් කොටසක් ඉලක්ක කරගෙන පුළුල්ව හා ක්‍රමානුකූලව සිදුකරන අපරාධවල

කොටසක් වශයෙන්, මරණයට පත් කිරීම, සමූලඝාතනය, වහල් කර ගැනීම, පිටුවහල් කිරීම, අන්තර් ජාතික මූලික නියමයන් උල්ලංඝණය කිරීමෙන් ශාරීරික නිදහස බරපතල ලෙස අහිමි කිරීම, කුරිරු වධ හිංසා, දූෂණය, ලිංගික වහල්භාවය, බලහත්කාරයෙන් ගැබ් ගැන්වීම, වන්ධ්‍යාකරණය හා සියලු ආකරයේ බරපතල ලිංගික ප්‍රචණ්ඩත්වය, හිංසා කිරීම්, බලහත්කාරයෙන් පුද්ගලයින් අතුරුදහන් කිරීම්, වර්ග භේද වාදය හෝ එවැනි ස්වභාවයේ වෙනත් අමානුෂික ක්‍රියා යනාදියයි.

- *ජන ඝාතන* (ICC නීතියේ 6 වැනි වගන්තිය) යනුවෙන් අදහස් කරනුයේ කිසියම් ජාතියක්, වර්ගයක්, භාෂාමය හෝ ආගමික කොටසක කණ්ඩායමක් එහි සාමාජිකයින් මරා දැමීමෙන් ශාරීරික හෝ මානසික හානියක් සිදු කිරීමෙන් සිතාමතා සමස්තයේම හෝ කොටසකගේ පැවැත්ම විනාශ කිරීම අරමුණු කරගත් තත්ත්වයන් ඇති කිරීමෙන් කණ්ඩායමකගේ දරු උපත් වැළැක්වීමේ පියවර ගැනීමෙන් හෝ කොටසකගේ දරුවන් වෙනත් කොටසකට බලහත්කාරයෙන් පැවරීමෙන් එම ජන වර්ගය, ජාතිය, කණ්ඩායම විනාශ කිරීම සඳහා කරන අපරාධයි.
- *යුධ අපරාධ* විස්තර කර ඇත්තේ (ICC නීතියේ 8 වැනි වගන්තිය) 1949 අගෝස්තු 12 ජිනීවා සම්මුතියෙන් හා අනෙකුත් අන්තර් ජාතික මානවවාදී නීති වලින් ද, විශේෂයෙන් මෙම ක්‍රියාවන් සටන් වලට, ක්‍රියාකාරීව සහභාගි නොවන අය (සාමාන්‍ය වැසියන් හෝ සිරකරුවන්) එල්ල කරගත් අන්තර් ජාතික හෝ දේශීය සන්නද්ධ ගැටුමකදී සිදු කරන බරපතල උල්ලංඝනය කිරීම් ලෙසිනි.

***විශාල වශයෙන් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්***

(බරපතල මානව අයිතිවාසිකම් කඩ කිරීම්, එනම් කුරිරු වධ හිංසා පැමිණවීම් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන මගින් සිදු කරන අතුරුදහන් කිරීම්) මෙම කොටසට අයත් වන්නේ පුළුල් හෝ ක්‍රමානුකූල ප්‍රහාරයක් වශයෙන් නොව වෙන් වූ (හුදකලා) ක්‍රියාවන්ය. මානව වර්ගයාට එරෙහි අපරාධ වලින් මේවා වෙනස් වන්නේ එම නිසාය.

***සම්බන්ධිත උල්ලංඝණය***

මේවා බරපතල මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් නොවන නමුත් එවැනිම පීඩාවට පත් කිරීම, මළ සිරුරු වලට අගෞරව කිරීම, දූෂණය කිරීමේ තර්ජනය ඇතුළුව ලිංගික හිංසනය, වෛද්‍ය ආධාර වැනි අත්‍යවශ්‍ය දෑ ලබ නොදීම, ව්‍යාපාර පිරිහීමට පත් කිරීම, බිය ගැන්වීම හා ඊ.කියාවලින් ඉවත් කිරීම වැනි ක්‍රියාවන්ය.

## වැරදිකරුවන්ගේ අභිප්‍රායන්

වැරදිකරුවන් ක්‍රියාත්මක වී ඇත්තේ නියෝග යටතේ හෝ මේ තර්ජනය කිරීම නිසා හෝ විය හැකිය. නැතිනම් ඔවුන් එම ක්‍රියාවන් සිදු කරන අවස්ථාවේ එය නීති විරෝධී නොවූවා විය හැකිය. ඔවුන් සාමාන්‍ය පුරවැසියන් මානව අයිතිවාසිකම් කඩ කරන්නන් බවට පත් කෙරෙන වෛරය දනවන කතා වලින් විපතට පත් වූවන් විය හැකිය. නීතිය කඩ කිරීම් නොසලකන සංස්කෘතියක් පැවතීම නිසා සමහර කඩ කිරීමේ ආකාරයෙන් නොපැහැදිළි වූවා විය හැකිය.

නිරන්තරයෙන්ම නිදහසට දක්වන කාරණයක් වන්නේ "අපි යුද්ධයකට මැදිව සිටින්නෙමු" යන්නයි. මතවාදය හා අරමුණු කෙරේ ඇති සැබෑ විශ්වාසය ද ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක විය හැකිය. ප්‍රචණ්ඩත්ව චක්‍රයක පළිගැනීම අභිප්‍රායක් විය හැකිය. කළින් වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් වෙනුවෙන් පළිගැනීමට නව ප්‍රචණ්ඩ ක්‍රියා යුක්ති සහගත කරනු ඇත. ඒවා වැඩි වැඩියෙන් ඉල්ලා සිටිනු ඇත.

රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් තම ක්‍රියාවන් බොහෝ විට "දේශපාලන අරමුණු සඳහා වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සේ හේතු යුක්ති කිරීමටත්, නිදහස දිනා ගැනීම සඳහා වූ තම අරගලයේදී රාජ්‍ය ප්‍රචණ්ඩත්වයට මුහුණදීම සඳහා නොවැළැක්විය හැකි ප්‍රතිචාර ලෙසත් දක්වනු ඇත. මෙය පොදුවේ ප්‍රචණ්ඩත්වයේ සදාචාරමය ප්‍රශ්නය මොහොතකට අමතක කිරීමෙන් පසු බොහෝ "සමාන්‍ය මිනිසුන්" තමන් විමුක්තිකාමීන් ලෙස හඳුන්වා ගෙන අකමැත්තෙන් වීරයන් බවට පත්වෙන "අති විශේෂ" ක්‍රියාවන්ට පෙළඹීම පිළිබඳ අව්‍යාජ පැහැදිළි කිරීමකි. ඇත්තෙන්ම දේශපාලන අභිප්‍රායන්, මත් ද්‍රව්‍ය ජාවාරම, නීති විරෝධී සංක්‍රමනික මාර්ග හෝ මෙහෙයුම්, පාලනය රැක ගැනීමේ සාපරාධී අරමුණු විය හැකිය.

## වැරදිකරුවන් හා සමගි සන්ධානය

**සිදු වූ ප්‍රචණ්ඩත්වයේ වැදගත්කම පිළිබඳව විපතට පත් වූවන්ගේ හා එය සිදු කළ අයගේ දැක්ම අතර විශාල පරතරයක් පවතී.**

වැරදිකරුවන්ට තම ක්‍රියාවන්ගෙන් විපතට පත් අය හා තම සමාජය සමග සමගි සන්ධානය වීම පහසු කළ හැක්ක් කෙසේ ද? එය බෙහෙවින් රඳා පවතින්නේ සන්දර්භය, වැරදිකරුවන්ගේ අභිප්‍රායන් දැක්ම මතය. සමහර විට මෙය සමගි සන්ධානය වීමට බරපතල බාධාවක් වේ. ප්‍රවේශම්කාරීව, නිවැරදි තත්ත්වයන් යටතේ ක්‍රියාත්මක කළහොත් වැරදිකරුවන් නැවත සමාජගත කිරීම සමගි සන්ධානය වීමේ දී තිරණාත්මක සාධකයක් විය හැකිය.

## සමාදානය වීමට ඇති බාධා

- *වරද පිළිනොගැනීම* **:** වරදක් වගකීමත් පිළිනොගැනීම කතිකාවන් ගණනාවක් මත පදනම් වූවකි. (ඉහතින් වූ 'අභිප්‍රායන්' බලන්න.)
- සිදු වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව විපතට පත් වූවන් හා එය සිදු කළ අය අතර එහි වැදගත්කම ගැන පවතින දැක්මේ වෙන්වීම *'විශාලත්වයේ පරතරයයි'* *(Magnititude Gap)* වැරදිකරුවන් තම ක්‍රියාවල වැදගත්කම හා ප්‍රතිඵලයන් වැදගත්කම අඩුවෙන් තක්සේරු කරන අතර ඉන් විපතට පත් වූවන් තම පීඩාවේ දැඩි බලපෑම දකී.
- *වගකීමක්' නොමැතිව සමාව අයැදීම* : වැරදිකරුවන් විසින් සමාව අයැදීම තීරණාත්මක වූවත් විපතට පත් වූවන් පිළිබඳව තම වගකීම පිළිගන්නේ නොමැතිව කරන සමාව අයැදීම් අවංක සමගි සන්ධානයකට යොමුවන්නේ නැත. විපතටපත් වූවන් බොහෝ දෙනෙකුම අසම්පූර්ණ සමාව අයැදීම් අපහාසයක් සේ සලකනු ඇත.

## එම වැරදි කළ අය නැවත සමාජගත කිරීම

ඉතාමත් සුදුසු කාර්ය වනුයේ වැරදිකරුවන් නැවත තම ප්‍රජාවට ඇතුළත් කර ගැනීමය. ඔවුන් තවදුරටත් ප්‍රජාවෙන් ඉවත් කර තැබීම සමාජයේ සමස්ත ඒකාග්‍රතාවයටත්, සමගි සන්ධානයටත් තර්ජනයක් වනු ඇත.

### නැවත සමාජයට ඇතුලත් කර ගත යුත්තේ ඇයි?

ඉක්මණින්ම හෝ කල් පසුවී වැරදිකරුවන් බොහොමයක් ප්‍රජාවටම ආපසු පැමිණෙනු ඇත. මෙම ආපසු පැමිණීම, පැහැදිළිව ආපසු ඇතුළත් කර ගැනීමේ පියවර සමග එක් නොවුවහොත්, ඉතිරිව සිටින විතට පත් වූවන්ට මහත් චිත්ත වේදනාවක් වනු ඇත. නැවත ඇතුළත් කර ගැනීමට වඩා සුවිශේෂ කරුණු වන්නේ,

- සිරගෙවල් පිරියෑම, මහජන අරමුදල් කෙරේ දැරිය නොහැකි බරක් ඇති කිරීම.
- පරිපාලන හා කළමනාකරණ කාර්ය මණ්ඩල වලට දඬුවම් දීම නිසා රටේ

දේශපාලන හා ආර්ථිකය යළි ඉදිකිරීමේ දී අවශ්‍ය මානව සම්පත් ඉවත් කිරීමක් සිදු විය හැකිය.

- බාහිර තර්ජනයක් දිගටම පැවතීම නිසා ජාතික සමගි සන්ධානයක් තුළින් ජනතාව ඉක්මණින්ම නැවත එකතු කිරීමේ අවශ්‍යතාවය වැඩි විය හැකිය.
- ජනතාවගෙන් සමහර කොටසක් භෞතික හා සමාජීය වශයෙන් දීර්ඝ කාලයක් වෙන් කොට තැබීම නිසා අන්තිමේදී උප සංස්කෘතීන් නිර්මාණය වීමටත්, ප්‍රජාතන්ත්‍රවාදයට හානි කර වූ ජාලයන් ඇති කිරීමටත් හේතුවන සමාජ හා දේශපාලන හුදකලා වීමකට තුඩු දිය හැකිය.
- නැවත එකතු කර ගැනීමට, අතිශයින්ම උණුසුම්කාරී තත්ත්වයක් සමනය කිරීමේ මූලික සාධකයක් වන නිරායුධ කිරීම ද ඇතුළත් ය.

## නැවත එකතු කළ හැක්කේ කෙසේද?

- ***නෛතික හා පරිපාලනමය බාධාවන් ඉවත් කිරීම.*** ඊට එළිමහන් සිරකඳවුරු, දඬුවම් හා මූල්‍යමය සම්බාධක ඉවත් කිරීම හෝ අඩු කිරීම. නිලතල හි සිවිල් අයිතීන් ලබාදීම හා පුනරුත්ථාපනය අයත්ය.
- ***පුනර්-සමාජයීයකරණය ක්‍රියාකාරී ලෙස ප්‍රවර්ධනය කිරීම.*** ප්‍රජාතන්ත්‍රවාදය හා මානව අයිතිවාසිකම් අගයන් ඇති කිරීම සඳහා දිගු කාලීන අධ්‍යාපන වැඩසටහන් අවශ්‍යය.
- ***වැරදිකරුවන් ප්‍රාදේශීය ප්‍රජා මට්ටමෙන් නැවත එකතු කිරීම.*** රාජ්‍ය නොවන සංවිධාන, ආගමික ආයතන හා වෙනත් පුරවැසි කණ්ඩායම් හා ප්‍රාදේශීය අධිකාරීන්ට, වැරදිකරුවන් පාසල්, රෝහල්, මහා මාර්ග වැනි දේ යළි ඉදි කෙරෙන ප්‍රජා මට්ටමේ ව්‍යාපෘතීන්ට සම්බන්ධ කර ගත හැකිය.
- ***සම්ප්‍රදායික භාවිතාවන් ඇතුළත් කිරීම.*** නැවත එකතු කර ගැනීම බොහෝ විට වැරදිකරුවන් නැවත ප්‍රජාවට එකතු කර ගැනීම පළ වෙන සම්ප්‍රදායික චාරිත්‍ර මත පදනම් වේ. මෙහි ඇති දර්ශනය වනුයේ නූතන අපරාධ විනිශ්චය පද්ධතීන්, ප්‍රාදේශීය ප්‍රජාව බල රහිත කොට සියලු බලය වෘත්තිකයන්ට භාර දී ඇත යන්නයි. චාරිත්‍ර වලින් අපරාධය සිදු වූ සන්දර්භයටම නැවත ගෙන යයි. මෙම ප්‍රවේශය ප්‍රතිස්ථාපනය කිරීමේ යුක්තිය *(Restorative Justice)* පිළිබඳ, පුළුල් දැක්මේම කොටසකි. (7 කොටස බලන්න.)

නැවත එකතු කර ගැනීමේ වැඩසටහනක් තුළින් වැරදිකරුවන් තමන්ගෙන් විපතට පත් වූවන් සමග සමගි සන්ධානය වනු ඇතැයි හෝ විපතට පත් වූවන් වැරදිකරුවන් සමග සමගි සන්ධානයක් ඇති කර ගනු ඇතැයි සහතිකයක් නොමැත. නමුත් ඉන් වැරදිකරුවන්ට තම හුදකලාවෙන් මිදීමට අවස්ථාවක් ලැබෙන අතර ප්‍රජා මූලික මූල පිරුම් වලදී තම හැසිරීම තුළින් විපතට පත් අය කෙරේ ඇති කළ හානිකර බලපෑම තේරුම් ගැනීමටත් ඒ අනුව ඔවුන් ප්‍රතිචාර දක්විය යුතු ආකාරය සිතා බැලීමටත් අවස්ථාවක් ලැබෙනු ඇත.

## 6 සුව කිරීම

**වැදගත් වන්නේ ගැටුම නිසා ජනතාව තුළ ඇති කළ බලපෑමට මුහුණ දීමට උදවුවීම පමණක් නොවේ. මෙම ආපදාවේ හේතු සාධක වලට මුහුණ දිය යුත්තේ කෙසේ ද යන්නත් අත්‍යවශ්‍ය කාරණයකි.**

චිත්ත වේදනාව සමාජයක පුද්ගලික සහ/හෝ සාමූහික ව්‍යුහයන් විනාශ කරවයි. නිදසුනක් වශයෙන් දුක්වීමේ ක්‍රියාවලියක් තුළින්, ගැටුම්

තමන් කෙරේ බල පැවැත් වූ ආකාරයට මුහුණ දීමට ජනතාවට උදව් දීම ද වැදගත්ය. නමුත් එහි හේතු වලට මුහුණදීම ද එමෙන්ම වැදගත්ය. සුවපත් කළ යුත්තේ චිත්ත පීඩාත්මක අවස්ථාවට හා ඉන් පසුව ඇති වූ තත්ත්වයට දක් වූ පුද්ගලික, දේශපාලනික, සමාජීය හා සංස්කෘතික ප්‍රතිචාරයන්ය. සංස්කෘතිය හා ප්‍රකාශනය මර්ධනය කිරීම, වාර්ගික නොඉවසීම හා වෙනස්කොට සැලකීම අනන්‍යතාවය, තමන්ගේය යන හැඟීම හා ආයතන කෙරේ ඇති විශ්වාසය බරපතල ලෙස යටපත් කිරීමට හෝ විනාශ කිරීමට හේතු විය හැකිය.

## සමගි සන්ධානය හා සුව කිරීම

සුව කිරීම පෞද්ගලික මට්ටමින් සිදු විය යුතු වුව ද, සමාජ සන්දර්භයක් සමග අන්තර් සම්බන්ධතාවයක් ද විය යුතුය. පෞද්ගලික සුව කිරීම හා ප්‍රචණ්ඩත්වයට මුහුණ දීම සඳහා සන්දර්භයක් ස්ථාපනය කිරීමේදී සමගි සන්ධානය ඉලක්ක කර ගත් දේශපාලන ක්‍රියාවලීන් හා උපාය මාර්ග වැදගත් වන අතරම එක් එක් පුද්ගලයා සුව කිරීමේ මාවත ඔහුට සුවිශේෂ වන බව ද තේරුම් ගත යුතුය. බොහෝ විට දේශපාලකයින් හා දේශපාලන ක්‍රියාවලින්, දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් ඍජුවම ගැලවී ගත් අයටත් වඩා ඉක්මණින් ඉදිරිපත් විය හැකිය.

## සුව කිරීමේ පිවිසුම

සුවකිරීමේ එකම ක්‍රියාවලියක් නොමැතිව වුවත් එක් එක් පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන්ට ඉඩ සැලසෙන අතරම ආපදාවට හේතු වූ සමාජයීය වාතාවරණය පරිණාමය වීමේ සංකලනයක් විය හැකිය.

- ***සන්දර්භය තේරුම් ගැනීම.*** සුව කිරීමේදී සමාජයීය හා සංස්කෘතික සන්දර්භය තේරුම් ගත යුතු අතර පුද්ගලයාට යොමු විය යුත්තේ සමස්ථයක් වශයෙනි. සුව කිරීමේ උපාය මාර්ගයක් ගොඩනගා ගැනීම සඳහා, හැම විටම ආරම්භක ස්ථානය විය යුත්තේ සන්දර්භයයි.
- ***දේශීය සම්පත් භාවිතා කිරීම.*** සමහර ප්‍රජාවන් සහ පුද්ගලයින් ආපදාවන්ට මුහුණ දීමට බෙහෙවින් දක්ෂය. හැකි සෑම අවස්ථාවකදීම එවැනි දක්ෂතා වලට උදව් දිය යුතු අතර ඒවා වර්ධනය කර ගැනීමටත් උත්සාහ කළ යුතුය. එමෙන්ම පවතින තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් කිරීමේදී පරීක්ෂාකාරී විය යුතුය. බොහෝ විට ප්‍රචණ්ඩත්වය නිසා එවැනි සම්ප්‍රදායික ක්‍රම විනාශ වේ.
- ***සුව කිරීම යළි ඉදිකිරීමේ පුළුල් වැඩසටහන් සමග සම්බන්ධ කිරීම.*** සත්‍යය, පිළිගැනීම හා සාධාරණත්වය සුව කිරීමේ ක්‍රියාවලියෙන් බැහැර කළ නොහැකිය. විපතට පත් එක් එක් පුද්ගලයින් සමග වැඩ කරන අය පුළුල් ක්‍රියාවලීන් ගැන දැනුවත් වීම අවශ්‍යය. තම අනන්‍යතාවය හා ගරුත්වය පිළිබඳ හැඟීම නැවත ඇති කර ගැනීමට විපතට පත් අයට උදව් දීමේදී සමාජ-දේශපාලන සන්දර්භයක් නැවත් ස්ථාපනය කිරීම හා සුව කිරීමේ මූල පිරුම පශ්චාත් ගැටුම් අවධියේදී සමාජ-ආර්ථික හා සංස්කෘතික යළි ඉදි කිරීමේ කොටසක් විය යුතුය.

## සුව කිරීමේ උපාය මාර්ග

සියලුම උපාය මාර්ග දේශීය සන්දර්භය තුළින් වර්ධනය විය යුතු අතර උපාය මාර්ග රැසක් එක්වර අනුගමනය කළ යුතුය.

- **මානසික සමාජයීය වැඩසටහන් :** මින් සමාජ හා සංස්කෘතික සන්දර්භයක් ප්‍රවර්ධනය කිරීමත්, යළි ගොඩ නැගීමත් සිදු වේ. කලාව සහ කතන්දර කීම,

අන්‍යොන්‍ය ආධාර කණ්ඩායම්, ශෝකවීමේ හා නැවත භූමදානය කිරීමේ චාරිත්‍ර, නැවත පුහුණුව, අධ්‍යාපනය හා නැවත කුසලතා ඇති කිරීම, ප්‍රජාවන් හා පවුල් වලට පුද්ගලයින් නැවත ඇතුළු කිරීම හා එකතු කිරීම උපදේශනය හා සාමූහික උදව්, තොරතුරු බෙදා හැරීම හා මුණ ගැසීම සඳහා ආරක්ෂිත පරිසරයක් නිර්මාණය ජාල ඇති කිරීම, අත්දැකීම් හුවමාරු කර ගැනීම හා නව චර්යාවන් ඇති කිරීම යන ක්‍රමයන් අයත් වේ. එක ප්‍රජාවක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි වුවත් ගැටුමේ විවිධ පාර්ශ්ව වල විපතට පත් අය එකට එකතු කිරීමෙන් සුව කිරීමේ ක්‍රියාවලිය සන්නද්ධ ගැටුමකට වඩාත් ක්‍රියාකාරී විරෝධතාවයක් ද විය හැකිය. සෑම තත්ත්වයකටම සියලුම මට්ටම් වලින් විරෝධතාවයක් ද විය හැකිය. සෑම තත්ත්වයකටම සියලුම මට්ටම් වලින් මැදිහත්වීම නොගැළපෙනු ඇත. එහෙත් චිත්ත පීඩාත්මක තත්ත්වයකට විවිධ ආකාරයෙන් මැදිහත්වීම සාමාන්‍යයෙන් බෙහෙවින් ඵළදායි වේ. මානසික-සමාජයීය වැඩසටහන් පවත්වා ගෙන යෑම මග පෙන්වීම පහත ෂඳහන් ප්‍රකාශන වල ඇත. ***ආරක්‍ෂණය හා සුභ සාධනය සඳහා වූ නෙදර්ලන්ත ආයතනය හා ලෝක සෞඛ්‍යය සංවිධානයේ සහයෝගිතා ප්‍රකාශකය 2000, ගැටුම් හා පශ්චාත් ගැටුම් තත්ත්වයන්ට මුහුණ දෙන සරණාගතයින්, අවතැන් වූවන් හා අනෙකුත් ජන කොටස් වල මානසික සෞඛ්‍යය.***

- ***උපදේශනය :*** මානසික ප්‍රතිකාර, කණ්ඩායම් වැඩ, පවුල් ප්‍රතිකාර, ප්‍රජාවගේ උපදේශනය හෝ සහයෝගය හැම විටම වෘත්තීමය සේවාවන් පමණක් විය යුතු නොවේ. එය සුපුරුදු පරිසරයක විපතින් ගැලවුණු අය (පුහුණු වෘත්තිකයෙකුගේ සහාය ඇතිව හෝ නැතිව) එකතු වී අදහස් හුවමාරු කර ගැනීමක් විය හැකිය. චිත්ත පීඩනය සඳහා උපදේශනය වඩාත් ඵලදායි විය හැකි වනුයේ අදාළ තත්ත්වයන් තුළ වඩාත් උචිත ආකාරයකින් කළහොත් පමණි.

- ***මනෝ සමාජයීය ආධාරක කුසලතා පිළිබඳව ප්‍රාදේශීව ප්‍රජාවන් පුහුණු කිරීම:*** පුහුණු වූවන්ට අනුබල සහයෝගය ලබා දීමක් නොමැතිව ප්‍රාදේශීය මිනිසුන් චිත්ත පීඩා උපදේශනය ෂඳහා පුහුණු කිරීමේදී සෞඛ්‍යය ආරක්‍ෂණ වෘත්තීකයින් යොදා ගැනීම සම්පූර්ණයෙන්ම අනුචිතය. දේශීය හා පිටකින් ලබා ගන්නා විවිධ ක්‍රම හා අදහස් අතර ඇති අන්තර් සම්බන්ධතාවයක් මත ගොඩ නැගෙන පුහුණු වැඩසටහන් වැදගත් විය හැකිය. ක්‍රියාකාරකම් පැහැදිළි කිරීමේදීත්, ඒවා ක්‍රියාත්මක කිරීමේදීත් සහභාගි වන්නන් තීරණාත්මක භූමිකාවක් ඉටු කළ යුතුය.

- ***අන්‍යොන්‍ය ආධාර කණ්ඩායම් :*** මිත් සුහදතාවය හෝ ප්‍රායෝගික උදවු ලැබේ. ඔවුහු පොදු ගැටළුවකට මුහුණ දී සිටින අතර අන්‍යොන්‍ය ආධාර ඇතිව තම ඉලක්ක කරා යති. මෙම කණ්ඩායම් වලට නායකත්වය ලැබෙන්නේ සාමාජිකත්වයෙනි. බොහෝ දෙනෙක්, උපදේශනය හා නැවත මිත්‍රත්වය ඇති කර ගැනීම වැනි සෘජු උදවු උපකාර කරන අතර තවත් අය පිළිගැනීම ඇතුළත් කර ගැනීම හා සාධාරණත්වය වැනි පුළුල් ඉලක්ක්යන් සඳහා දිගටම පෙනී සිටිනු ඇත. විපතට පත් වූවන්ගේ අන්‍යෝන්‍ය ආධාර කණ්ඩායම් අත්දැකීම් ගැටළු හා විසඳුම් බෙදා හදා ගැනීමටත්, දැනුවත් භාවය වැඩි කිරීමටත්, වෙනසක් සඳහා බලපෑම් කිරීමටත්, තොරතුරු හුවමාරු කර ගැනීමටත් ඉවහල් වනු ඇත.

- ***සුවපත් කිරීමේ සංකේතාත්මක ආකාරයන්* :** සංකේතාත්මක ක්‍රියා දේවල් හා චාරිත්‍ර දුක්වීමේ ක්‍රියාවලියේ කේන්ද්‍රය වශයෙන් ක්‍රියා කොට චිත්ත පීඩාත්මක සිද්ධියක් සනීභවනය කිරීමට හේතු විය හැක. එවැනි සංකේතාත්මක දේ පුද්ගල බද්ධ වන්නේ නම් හා සංස්කෘතික වශයෙන් ගැලපෙන්නේ නම් වඩාත් ඵලදායි වේ. අතීතයෙන් පාඩම් ඉගෙන ගැනීමට සිහිපත් කිරීමෙන් පුළුල් පළ ප්‍රයෝජනයකින් ද යුතු වේ.
  - **අතීතයේ සිහිවටන ස්මාරක** කෞතුකාගාර හා පලක වශයෙන් ද, සාම පීඩාවට පත් වූවන්ගේ අදහස්, අයිතිවාසිකම් හා අපේක්ෂාවන්, නිල නිවේදන, රජයේ ස්ථාන, පාරවල් හෝ ගොඩනැගිලි ඔවුන් නමින් නම් කිරීමෙන් පිළිගැනීමට ලක් කළ හැකිය.
  - **අවංක සමාව ගැනීම :** අවංක සමා ගැනීමෙන් ද වැදගත් බලපෑමක් ඇති කළ හැකිය.
  - **වන්දි ගෙවීම් හා හානි පූර්ණය:** වන්දි ගෙවීම් හා හානි පූර්ණය වැනි ප්‍රදානයන් තුළින් රජයේ වැරදි පිළිගැනීම විපතින් ගැළවුනු අයගේ ගරුත්වය ලබාදීම අතීතයේ තුවාල සුව කිරීමට සහභාගි වීම් හා සම්බන්ධ සාමාන්‍ය ජනතාවගේ සදාචාරමය වගකීම පිළිබඳව මහජන සවිඥානකත්වය නග සිටුවීම කළ හැකිය.
  - **විශේෂ වතාවත් හා උත්සව :** බලවත් සංකේතාත්මක හා සුවපත් කිරීමේ වටිනාකමකින් යුක්ත විය හැකිය.

සුව කිරීමේ ක්‍රියාවලිය සිදු වන්නේ විශ්‍රාම වැටුපක්, ස්මාරකයක් හෝ නැවත ගොඩ ගැනීමක් වැනි දේ තුළින් නොව නැවත හුමදානය කිරීමේ වතාවත් වැනි ඒ වටා සිදුවන ක්‍රියාවලින්ගෙනි. සුව කිරීමේ සංකේතාත්මක ආකාරයෙන් පුළුල් සන්දර්භයෙන් සම්පූර්ණයෙන්ම වෙන් කළ නොහැකිය. වරද පිළිගැනීම සමාව හා සැලකිය යුතු භෞතික ආධාරයෙන් පවා මළ මිනිසෙකු නැවත ජීවත් කර වීමට හෝ අත්විඳි සියලු මානසික පීඩාවන් සමනය කිරීමට සමත් වන්නේ නැත. හානි පූර්ණයක් හෝ සමාව ගැනීමක් භාර ගැනීමෙන් ජීවත් වන අය තුළ තම ආදරනීය ඥාතීන් පිළිබඳව විවිධ සිතුවිලි ඇති කළ හැකිය. සංකේතාත්මක ක්‍රියාවන් සත්‍යය, යුක්තිය හා සමාජ වෙනසක් හා බැඳී නැත්නම්, අතීතය අමතක කර දැමීමේ හා ජීවත් වන අය මිලදී ගැනීමේ රජයේ උපාය මාර්ගයක් ලෙස දකිනු ඇත.

# 7 යුක්තිය

## එකට එක කිරීමේ යුක්තිය

*(Retributive justice)*

**එකට එක කිරීම සතුටුදායක හා සමගි සන්ධානය වීමේ යුක්තිය ලබා දීමෙන්, සමගි සන්ධානය හා ප්‍රජාතන්ත්‍රීකරණ ක්‍රියාවලින් අනතුරට ලක් කිරීමේත් ඉඩකඩ පවතින තත්ත්වයකි.**

අතීතයේ අපරාධ පිළිගැනීම හා ඊට දඬුවම් ලබාදීම යන්නෙන් යුක්තිය ඉටු කිරීම අපේක්ෂා කෙරේ. නමුත් යුක්තිය විවිධාකාර මුහුණු වර ගනී. එය එකට එක කිරීම හා නඩු පැවරීම මත පදනම් විය හැක. එය ප්‍රකෘතිමත් කිරීම හා මැදිහත්වීමක් මත පදනම් විය හැකිය. සත්‍යය සෙවීමේ කොමිසම් සභා මගින් ඓතිහාසික යුක්තිය ඉටු වේ. හානි ප්‍රතිපූර්ණ ප්‍රතිපත්ති වලින් අදහස් වනුයේ වන්දි ලබා දීමේ යුක්තියයි. වැරදිකරුවන්ට දඬුවම් දිය යුතුය යන හැඟීම නිසා එකට එක කිරීමේ පැතිමානය කෙරේ වැඩි අවධානයක් යෙදීමේ ප්‍රවනතාවයක් වුව ද, ප්‍රවේසම් විය යුතු කරුණු කිහිපයක් ඇත. තීරණාත්මක අභියෝගය වන්නේ

සදාචාරමය අවශ්‍යතා හා දේශපාලන යථාර්ථය අතර තුලනයක් ඇති කර ගැනීමය. එකට එක කිරීම සතුටුදායක හා සමගි සන්ධානය වීමේ යුක්තිය ලබා දීමේත් සමගි සන්ධානය හා ප්‍රජාතන්ත්‍රියකරණ ක්‍රියාවලීන් අනතුරට ලක් කිරීමේත් ඉඩ කඩ පවතින තත්ත්වයකි. දේශපාලන හෝ ආර්ථික තත්ත්වයන් නිසා එකට එක කිරීමේ යුක්තිය කෙරේ අවධානය යොමු වීම පශ්චාත් ගැටුම් උපාය මාර්ගයක් ලෙස සරලව භාවිතා කළ නොහැකි විය හැකිය. එකට එක කිරීමේ යුක්තිය වැරදිකරුවන් කෙරේ අවධානය යොමු කළත් විපතට පත් වූවන්ගේ සැබෑ හැඟීම් හා අවශ්‍යතාවයන් අමතක කිරීමට හෝ පසෙකට දැමීමට ඉඩ ඇත. ඊට අමතරව නඩු විභාග සමහර විට විරසක වීම් වැඩි කොට සමාදානය වීමේ ක්‍රියාවලියට බාධා විය හැකිය.

## එකට එක කිරීමේ යුක්තියේ වාසි

- පෞද්ගලිකව පළි ගැනීමේ අනතුර අඩු කරවයි. (සුපරීක්ෂාකාරීත්වය, කැලෑවේ නීතිය වැනි)
- අපරාධ සිදු කළ අය බලයට පැමිණීම වැළැක්වීමෙන් අතීතයේ වූ දේ නැවත සිදු නොවන බවට ජනතාව තුළ විශ්වාසයක් ඇති වීම.
- ප්‍රසිද්ධියේ වැරදි පුද්ගලයා, නිවැරදි පුද්ගලයා කවු ද යන්න පිළි ගැනීමෙන් විපතට පත් අයගේ ආත්ම විශ්වාසය ප්‍රතිස්ථාපනය කොට, ඔවුන්ගේ මානසික වේදනාවන් සමනය කිරීමේ වගකීම ඉටු කිරීම.
- වැරැද්ද පුද්ගලයින්ට පැවරීම. අපරාධ අධිකරණය පුද්ගලයින්ගේ වගකීම තහවුරු කරන නිසා සම්පූර්ණ ප්‍රජාවම එකිය යුතුය යන භයානක හැඟීම තුරන් කිරීම.
- එය සුජාත භාවයත්, ප්‍රජාතන්ත්‍රීකරණය ක්‍රියාවලියත් ශක්තිමත් කොට වාර්ගික හා දේශපාලන පුනර්ජීවනයකට මහ පාදයි. ඉන් ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තහවුරු කොට ඒවා ක්‍රියාත්මක කිරීමට නව පාලනයට ඇති හැකියාව ගැන මහජන විශ්වාසය ඇති කරවයි.
- එය නීතිය කැඩීම ඉවසා සිටීමේ චක්‍රය බිඳ දමා අනාගත මානව හිමිකම් කඩ කිරීම් අධෛර්යමත් කරවයි.

## එකට එක කිරීමේ යුක්තියේ සීමාවන් හා අනතුරු

- ***ප්‍රමුඛතා :*** පශ්චාත් ගැටුම් දේශපාලන සංස්කෘතික හා ඓතිහාසික සන්දිස්ථානයේදී නිශ්චිත අවස්ථාවකදී නඩු විභාග තුළින් යුක්තිය ඉටු කිරීමට වඩා වෙනත් අවශ්‍යතා වඩාත් හදිසි විය හැකිය.
- ***දුර්වල සාමකාමී විසඳුමක් අස්ථාවර කිරීම.*** නඩු පැවරීමේ තර්ජනයට පැරණි හමුදා නායකයින් කුමන්ත්‍රණයකින් හෝ කැරැල්ලකින් ප්‍රතිචාර දැක්වීමට ඉඩ කඩ තිබිය හැකිය.
- ***සතුරු උප සංස්කෘතීන් හා ජාලයන් කුපිත කරවීම.*** අපරාධ අධිකරණයේ තීන්දු වලින් ප්‍රජාතන්ත්‍රවාදයට සතුරු වූ අස්ථායි උප සංස්කෘතීන් හා ජාලයන් උනන්දු කරවා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිතවීමට බාධා පැමිණ විය හැකිය.
- ***පාලනය අඩපණ වීම.*** පරිපාලන හා කළමනාකරණ කාර්ය මණ්ඩලය විශාල වශයෙන් ඉවත් කොට පාලනය දුර්වල කිරීමෙන් අත්‍යවශ්‍ය වූ දේශපාලන හා ආර්ථික සංවර්ධනයට හානියක් සිදුවිය හැකිය.

## එකට එක කිරීමේ යුක්තියට ඇති භෞතික බාධා

- සාක්ෂි විනාශ වුවා විය හැකිය. ඔප්පු කිරීමට නොහැකි වීම නිසා ප්‍රකට වැරදිකරුවන් නිදහස් වීමට ඉඩ ඇත. ඉන් සමස්ත ක්‍රමය පිළිබඳවම විපතට පත් අයගේ විශ්වාසය බිඳ වැටෙනු ඇත.

- අපරාධ අධිකරණ ක්‍රමය, යුක්තිය ඉටු කිරීමට අසමත් විය හැකිය. අධිකරණය අසාධාරණ සහ/හෝ යටිතල පහසුකම් දැඩි ලෙස හානියට පත් කරන එක් මූලාශ්‍රයක් විය හැකිය. අකාර්යක්ෂම අධිකරණය තරම් හානිදායක වෙනත් දෙයක් නොමැත.
- අපරාධ නඩු පැවරීම නිසා සමාදාන ක්‍රියාවලියට බාධා පැමිණීම හෝ එය ආපසු හැරවීම සිදු විය හැකිය. සමහර විට නායකයෝ සමගි සන්ධානය වීමේ මූල පිරුම් වලට හානියක් වනු ඇතැයි බියෙන් වැරදිකරුවන් උසාවි ගෙන නොයාමට තීරණය කරති. මේ සඳහා නොයෙකුත් හේතු තිබිය හැකිය. පළමුවෙන්ම සම්පත් පිළිබඳ ප්‍රශ්නයක් නිසා හෝ පවතින සමාජ වාතාවරණය නිසා මනා සාධාරණ හා ඵලදායි නියෝගයක් කිරීමට ඒ වන විටත් නොහැකි වනු ඇත. දෙවනුව ප්‍රචණ්ඩ ගැටුම් වලින් පසුව එකට එක කිරීමේ යුක්තිය බොහෝ විට අවශ්‍යයෙන්ම නීතියේ ආධිපත්‍ය පිළබඳ මතකයන් හා මානව අයිතිවාසිකම් අභිබවා යෑමටත්, ජයග්‍රාහකයාගේ යුක්තිය (*Victor's Justice*) පිළිබඳ හැඟීමක් ඇති කිරීමටත් පැරණි දේශපාලන හා පුද්ගලික කෝන්තර පිරිමසා ගැනීමටත් හේතු විය හැකිය. තුන්වෙනුව බොහෝ පශ්චාත් ගැටුම් අධිකරණ ක්‍රමයන්ට හොඳින් සම්පත් නොමැති වීම නිසා අපරාධ බොහෝමයක් විනිශ්චය කළ නොහැකි වනු ඇත. වැරදිකරුවන් ඉතා සුළු ප්‍රමාණයකට නඩු පවරා දඬුවම් ලබා දීමෙන් එම ක්‍රියාවලිය හිතු මතෝට වැඩ කරන එකක් සේ පෙනෙනු ඇත.
- **නඩු විභාගයක්** මගින් පුද්ගලයින්ගේ වැරදි හඳුනා ගන්නා නමුත්, ප්‍රචණ්ඩත්වයට හා භීතියට තුඩු දුන් විවිධ හේතු හා භාවිතාවන්ගේ පුළුල් ආකාරයන් හඳුනා නොගනු ඇත. වැඩි දුරටත් නඩු විභාගයෙන් හඳුනාගන්නේ සාපරාධී වැරැද්ද විනා දේශපාලන හෝ සදාචාරමය වගකීම නොවේ.

## අන්තර් ජාතික විනිශ්චය සභා

**බරපතල මානව අයිතිවාසිකම් කඩ කිරීම් පිළිබඳව වගකිව යුතු අයට නඩු පැවරිය යුතු නම් අපරාධය සිදු කළ රටින් බැහැරව ක්‍රියාත්මක වන අධිකරණයක් ඉදිරියේ එය කිරීම පිළිබඳව පොදු එකඟතාවයක් මතුව ඇත.**

විශ්ව අධිකරණ මූල ධර්මය අනුව බරපතල මානව අයිතිවාසිකම් කඩ කිරීම් පිළිබඳව වගකිව යුතු අයට අවශ්‍ය නම් අපරාධය සිදු කළ රටෙන් බැහැරව ක්‍රියාත්මක වන අධිකරණයකින් එය සිදු කළ යුතු බව පෙන්වා දේ. අන්තර්ජාතික අධිකරණ ක්‍රමයේ ආකාර කීපයක් ඇත.

- **විශේෂ විනිශ්චය සභා** එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය අන්තර් ජාතික අපරාධ විනිශ්චය සභා දෙකක් පිහිටුවා ඇත. 1993 දී පැරණි යුගොස්ලෝවියාව සඳහා වූ අන්තර් ජාතික අපරාධ විනිශ්චය සභාව (ICTY) හා 1994 දී රුවන්ඩාව සඳහා වූ අන්තර් ජාතික අපරාධ විනිෂ්චය සභාව (ICTR) යනුවෙනි.
- අන්තර් ජාතික අධිකරන ක්‍රමයේ නව ප්‍රවනතාවයක් වනුයේ ජාතික හා අන්තර් ජාතික අපරාධ අධිකරණවල සංකලනයක් නිර්මාණය කිරීමය. නිදසුනක් වශයෙන් සියරාලියොන්හි ඇත්තේ අන්තර් ජාතික හා සියරාලියෝන් නීතිය හා විනිශ්චයකරුවන්ගේ සංකලනයක් සහිත විනිශ්චය සභාවකි.
- ස්ථිර අන්තර් ජාතික අපරාධ අධිකරණයක් ස්ථාපනය කිරීම, නුරෙම්බර්ග් හා ටෝකියෝ යුධ අපරාධ විනිශ්චය සභා හා ICTY හා ICTY වැනි මානව වර්ගයාට එරෙහි අපරාධ

පිළිබඳව නඩු පැවරීමට යොදාගත් තාවකාලික යන්ත්‍රණය වෙනුවට වඩාත් ඵලදායි ක්‍රමයකි.

ඒ අනුව අන්තර් ජාතික විනිශ්චය සභා හෝ අන්තර් ජාතික අධිකරනය මත පදනම් වූ ජාතික නඩු විභාග දේශීය නඩු විභාග වෙනුවට හොඳම ඌන පූරකයක් හෝ විකල්පයක් ලෙස දැකිය හැකිය. එය නිසැකයෙන්ම බිය වැද්දීම්, භෞතික බාධා, ක්‍රියා පටිපාටි, ප්‍රමිතීන් කඩ කිරීම, පුහුණු පුද්ගලයන් නොමැති වීම හා ජයග්‍රාහකයාගේ යුක්තිය පිළිබඳ චෝදනා වැනි කරුණුවලට අඩුවෙන්ම ගොදුරු වන්නකි. එහෙත් ICTY හා ICTR සැබෑ අත්දැකීමෙන් පෙනී යන්නේ ඒවා ද සාධක කීපයකින් සීමා වන බවයි.

- ***බලය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් නොමැති වීම*** නිසා ඵලදායක බව හා මහජන විශ්වාසය යහපත් කළ හැකිය. විනිශ්චය සභාවකට අත් අඩංගුවට ගැනීමේ වරෙන්තු නිකුත් කළ හැකි වුවත් ඔවුන් අල්ලා ගැනීමේ පොලිස් බලතල නොමැත.
- එදිරිවාදිකම් සම්පූර්ණයෙන්ම නැවතීමට පෙර සිය වැඩ කටයුතු ආරම්භ කළ හැකි වුවත් ***විනිශ්චය සභාවකට සිදු වෙමින් පවතින ගැටුමක් නතර කිරීමට නොහැකිය.***
- ***නඩු පැවරීමේ විෂය ක්ෂේත්‍රය රඳා පවතින්නේ ගැටුම් අභ්‍යන්තර ද අන්තර් ජාතික ද යන්න මතය.*** ජිනීවා සම්මුතීන් යටතේ ගැටුම අභ්‍යන්තර එකක් නම් වැරදි සිදු කළ පුද්ගලයන්ට විරුද්ධව නඩු පැවරිය හැකි වනුයේ ජන ඝාතන හෝ මානව වර්ගයාට එරෙහි අපරාධ සම්බන්ධයෙනි. මානවවාදී නීතිය හා අනෙකුත් යුධ අපරාධ පිළිබඳ ජිනීවා සම්මුතීන් බරපතළ ලෙස කඩ කිරීම් ගැන නොවේ. (එහෙත් අන්තර් ජාතික අපරාධ අධිකරණයට මෙවැනි සීමාවක් නොමැත.)
- ***මානව අයිතිවාසිකම් අපරාධවලට විශ්ව ප්‍රතිචාරයක් ලෙසින් එකට එක කිරීමේ යුක්තිය ඉදිරිපත් කිරීමේ අනතුරු*** අන්තර් ජාතික ආයතන හා රාජ්‍ය නොවන ආයතන විශ්ව අධිකරණ බලයක් සඳහා බලපෑම් කිරීමෙන් එකට එක කිරීමේ යුක්තිය කෙරෙහි පමණක් අවධාරනය කිරීමක් දැකිය හැකිය. මෙය සිදුව ඇත්තේ, ප්‍රකෘතිමත් කිරීමේ යුක්තිය සඳහා වඩාත් නොවිධිමත් මැදිහත් වීම කෙරේ යොමු වූ යාන්ත්‍රනයන් සඳහා විශේෂයෙන්ම සංවර්ධනය වන රටවල සමගාමීව මෙන්ම ඊට පටහැනිව ද වැඩි සහයෝගයක් පළව තිබියදී ය.
- ***නිශ්චිත කාරණයන් සඳහා පත් කරන විනිශ්චය සභා වියදම වැඩි, කාලය වැඩියෙන් ගතවන, ජනතාවගෙන් ඈත් වූ ඒවා විය හැකිය.*** ජාතික හා අන්තර් ජාතික කොටස් මිශ්‍ර වූ විනිශ්චය සභා හා අන්තර් ජාතික අපරාධ අධිකරනය (ICC) මගින් සමහර ප්‍රශ්න ඉවත් කරනු ඇත.

## එකට එක කිරීමේ යුක්තියට (*Retributive Justice*) විකල්පයන්

පශ්චාත් ගැටුම් යුක්තිය විසඳීමේ ක්‍රමයකින් එකට එක කිරීමේ යුක්තියේ කිසියම් ආකාරයක් සම්පූර්ණයෙන්ම බැහැර කිරීම ඉතා දුෂ්කරය. එහෙත්, එකට එක කිරීමේ යුක්තිය වඩාත් අනතුරුදායක හෝ දුෂ්කර මාර්ගයක් වන්නේ නම් නොයෙකුත් විකල්ප හා අතිරේක මාර්ග ගණනාවක්ම ඒ සඳහා පවතී. ඉන් එකක් වන්නේ පවිත්‍ර කිරීමයි. (*Lustration*) දෙවැන්න ක්ෂමාවයි. තුන්වැන්න වනුයේ ප්‍රකෘතිමත් කිරීමේ යුක්තියයි.

හතර වැන්න සත්‍යය සෙවීමේ කොමිසමේ සහ/හෝ හානි පූර්ණ වැඩ සටහන් ය. පසුව සඳහන් කළ කරුණු දෙකම විධිමත් ආකාරයේ දඬුවම් නොපමුණුවා යුක්තිය ලබා දීමේ ක්‍රමයකි. සත්‍යය සෙවීමේ කොමිසමේ හා හානි පූර්ණ මෙය 8 හා 9 කොටස්වල සඳහන් වන අතර මෙහි දී පළමු කරුණු තුන සැළකිල්ලට ගනිමු.

## පවිත්‍ර කිරීම (*Lustration*)

පැරණි රාජ්‍යයේ නියෝජිතයන් නුසුදුස්සන් කිරීම හෝ පවිත්‍ර කිරීම යනු ආක්‍රමණයට හා මර්ධනයට වගකිව යුතු අයට දඬුවම් දීමයි. එවැනි අධිකරණමය නොවූ නොයෙකුත් ආකාරයේ විනයානුකූල පියවර ඇත. ඒ දේශපාලන නුසුදුස්සන් කිරීම, ඡන්ද බලය අහිමි කිරීම, පොලිසිය, හමුදාව හා රාජ්‍ය පාලනය වැනි රජයේ සේවයෙන් බැහැර කිරීම සහ කලින් විශ්‍රාම ගැන්වීම හෝ වැදගත් නොවන තනතුරුවලට මාරු කිරීම වැනි දඩි නොවූ පියවර යනාදියයි.

## ක්ෂමාව

දඬුවම් නොදීමේ විෂම චක්‍රය බිඳ දමන්නේ නැතිනම් සමගි සන්ධානය වීම මූලික වශයෙන් අනතුරට ලක් කෙරේ. මුක්තිය (*immunity*) දඬුවම් නොදීමේ වර්ගයකි. එය රාජ්‍ය නායකයන්ට එරෙහිව නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂා කිරීම සඳහා අන්තර් ජාතික සම්ප්‍රදායික භාවිතය තුළ ගැබ්ව පවතී. සමහර අවස්ථාවල කැරලි ව්‍යාපාර වල නායකයින්ට දේශීය ව්‍යවස්ථා තුළින් තාවකාලික හා සීමිත වැලැක්වීමේ හැකියාවක් ලබා දීමෙන් සාමය ඇති කිරීම පහසුය. මුක්තිය ලබා දීමේ ඉතාමත් සුලභ ක්‍රමය වනුයේ ක්ෂමා ව්‍යවස්ථාවන් තුළිනි.

ක්ෂමාව දීමේ නොයෙකුත් ආකාරයන් ඇත. එහෙත්, එය හැම විටම, බොහෝ දෙනෙක් කලකිරීමට පත් කරවන, සැකය වැඩි කරවන හා සමගි සන්ධානය වීමේ සමස්ත ක්‍රියාවලිය ගැනම මහජන අප්‍රසාදය ඇති කරවන වැඩි අනතුරක් සහිත විකල්පයකි. පශ්චාත් ගැටුම් සමාජයන්හි එය විවාදයට ලක් වූ කාරණයකි. සාමාන්‍යයෙන් එය සමගි සන්ධානය වීමේ ක්‍රියාවලියට බාධා කරවයි. සම්පූර්ණ ක්ෂේත්‍රයේම වූ ඒක පාර්ශ්වීය ක්ෂමාවන් මග හැරිය යුතුය. එසේ වුවත් ප්‍රචණ්ඩ ගැටුමක අවසානයේ ඇති නොවන්නේ නම් අන්තිම පියවර වන්නේ ක්ෂමාවයි. එවිට වුවත් දැඩි කොන්දේසි පැනවිය යුතුය. වෙනත් කරුණු අතර ඊට ක්ෂමා නීතියක් පැනවීමට පෙර මහජන විවාදයකට ඉඩ සැලසීම, හැකිතාක් දුරට සත්‍යය සෙවීම හා හානි පූර්ණය හා කිසියම් මානව අයිතිවාසිකම් ගිවිසුම් යටතේ පැවරී ඇති අන්තර් ජාතික යුතුකම් වලට සම්පූර්ණයෙන්ම ගරු කිරීම යනාදිය අයත් වේ.

## ප්‍රකෘතිමත් කිරීමේ යුක්තිය (*Restorative Justice*)

**ප්‍රකෘතිමත් කිරීමේ යුක්තිය ක්‍රියාත්මක වන්නේ විපතට පත් අයගේත්, අදාළ ප්‍රජාවගේත් පූර්ණ සහභාගිත්වය ඇතිව සම්බන්ධතාවයන් යළි ඇති කිරීම සඳහා ය.**

අපරාධ හුදු දඬුවම් දීමේ ක්‍රමයක් ලෙසින් පමණක් සැලකීම ගැන වර්ධනය වන නොසතුට නිසා එකට එක කිරීමට අතිරේක හෝ විකල්පයක් වන යාන්ත්‍රනයන් සඳහා සොයා බැලීමේ උනන්දුව වඩාත් වැඩි විය.

ප්‍රකෘතිමත් කිරීමේ යුක්තිය වැරදි කිරීම සළකන්නේ වෙනත් ආකාරයටය. එය ක්‍රියාත්මක වන්නේ හේතු සාධක සාකච්ඡා කිරීමේදීත්, නොමනා හැසිරීම්වලට හේතූන් හඳුනා ගැනීමේදීත්, සම්බාධක තීරණය කිරීමේදීත් අදාළ ප්‍රජාවන් හා විපතට පත් වූවන්ගේ පූර්ණ සහභාගිත්වය ඇතිව ය. අවසාන ඉලක්කය වන්නේ හැකිතාක් දුරට විපතට පත් අය හා වැරදිකරුවා අතරත් ඔවුන් අයත් වන පුළුල් ප්‍රජාව තුළත්

සම්බන්ධතා නැවත ඇති කිරීමය. වැරදිකරුවාට නැවත දඬුවම් ලබා දීමට වඩා පුළුල් (සමහර විට වැඩි බලාපොරොත්තු සහිත) ඉලක්කයකි. න්‍යායික වශයෙන් හෝ සමගි සන්ධානය වීමේ ප්‍රතිපත්තියේ පුළුල් අරමුණුවලට පැහැදිළිවම ගැලපෙන එකකි.

යුක්තිය ලබා දීමේ සම්ප්‍රදායික ආකාරයෙන් අතීත මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව යෙදෙන වඩා විධිමත් හා දඬුවම් ලබා දීමේ ක්‍රමයන්ට ඌන පූර්ණයක් හෝ ඒවා වෙනස් කිරීමක් විය හැකිය. එසේ වුවත් සැක සංකා කීපයක් ඇත. මෙම සම්ප්‍රදායික යාන්ත්‍රණයන්හි කැපී පෙනෙන දුර්වල තැන් කීපයක්ම පවතී. එම නිසා බොහෝ විට සාධාරණ නඩු විභාගයක් ලැබෙන්නේ නැත. සාමාන්‍යයෙන් ඒවා මුලින්ම හැඩ ගැසී ඇත්තේ සොරකම් කිරීම, අසල්වැසියන් අතර ගැටුම් වැනි සුළු වැරදි කුඩා සංඛ්‍යාවක් පිළිබඳවය. මහා පරිමානයෙන් සිදුවන බරපතල අපරාධ සම්බන්ධයෙන් ඒවා ඔරොත්තු දෙන්නේ ද? තවමත් පශ්චාත් ගැටුම් තත්වයක් තුළ ප්‍රකෘතිමත් කිරීමේ යුක්තිය ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම් ඇත්තේ සුළු ප්‍රමාණයකි. මේ පිළිබඳව මෙතෙක් ගත් එඩිතරම පියවර වනුයේ 1994 ජන ඝාතනයේ සැකකරුවන්ට නඩු පැවරීම කඩිනම් කිරීමටත්, ජනතාවගේ සහභාගීත්වය වර්ධනය කිරීමටත් එම ක්‍රියාවලියට මැදිහත් වීමේ හා සමාදානය වීමේ ලක්ෂණ ඇතුළත් කිරීමටත් රුවන්ඩාවේ විනිශ්චය සහ ප්‍රතිව්‍යුහගත කිරීමය. ප්‍රකෘතිමත් කිරීමේ යුක්තියේ යාන්ත්‍රනයන්හි කැපී පෙනෙන ලක්ෂණ, ශක්තීන් හා දුර්වලතා මෙසේ ය.

## කැපී පෙනෙන ලක්ෂණ

- ප්‍රශ්නය සමස්ත ප්‍රජාවගේ හෝ කණ්ඩායමේ එකක් ලෙස දකී.
- අවධාරණය වන්නේ සමගි සන්ධානයේ හා ප්‍රකෘතිමත් කිරීමේ සමාජයීය එකමුතු භාවයයි.
- සම්ප්‍රදායික තීරකයින් පත් කරන්නේ සමාජ තත්වය හා පරම්පරාව මත පදනම්ව ප්‍රජාව තුළින්මය.
- ඉහළ මට්ටමක මහජන සහභාගීත්වයක් පවතී.
- සම්ප්‍රදායික නීතිය සම්මුතියකට එළඹීමේ දී සැළකිල්ලට ගනු ලබන එක සාධකයක් පමනි.
- සාක්ෂි හා ක්‍රියාපටිපාටි නියමයන් නම්‍යශීලීය.
- වෘත්තික නීති නියෝජනයක් නොමැත.
- ක්‍රියාවලිය ස්වේච්ඡා වන අතර තීරණ ගනු ලබන්නේ එකඟතාවය මතය.
- ප්‍රකෘතිමත් කිරීමේ දඬුවම් පිළිබඳ අවධාරණයක් ඇත.
- තීරණ බලාත්මක කිරීම සමාජයීය බලපෑම තුළින් සහතික කෙරේ.
- තීරණ තහවුරු කරන්නේ නැවත එකතු කිරීමේ චාරිත්‍ර තුළිනි.

## ශක්තීන්

- ඒවා දේශීය (හා ග්‍රාමීය) ජනතාවට පිවිසිය හැකි අතර පවත්වනු ලබන්නේ දේශීය භාෂාවෙනි. ඇවිද යා හැකි දුරක, සරළ ක්‍රියාපටිපාටිවලින් සමන්විතව ප්‍රමාදයන් නොමැති වීම.
- සමගි සන්ධානය, වන්දි ගෙවීම, ප්‍රකෘතිමත් කිරීම හා පුනරුත්ථාපනය වැනි ඔවුන් ඉදිරිපත් කරන විනිශ්චයන්, තම අසල්වැසියන් සමග නිරන්තර සහයෝගය මත විශ්වාසය තබන, එකට ගැට ගැසුණු ප්‍රජාවන් තුළ ජීවත් වන මිනිසුන්ට වඩාත් උචිතය.
- විපතට පත් අයට වැරදිකරුට හා ප්‍රජාවට, ගැටුම් සඳහා කල් පවත්නා විසඳුමක් සොයා ගැනීමේ දී සැබෑ හඬක් ලබා දීමෙන් ඉහළම සහභාගිත්වය පවතී.
- අනුගමනය කළ යුතු නියමයන්, ඒවා කඩවීම් ඇති වීමට හේතු වූ තත්වයන් හා තවමත් පවතින ගැටුම් සාමකාමීව

විසඳා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව ප්‍රජාවේ සියළු සාමාජිකයන් දැනුවත් කිරීමට ඉවහල් වේ.

- සිරගත නොකෙරෙන දඬුවම් මගින් සිරගෙවල් වල තදබදය අඩු කරයි. බන්ධනාගාර සඳහා වූ ප්‍රතිපාදන සමාජ සංවර්ධන කාර්යන් සඳහා යොමු කළ හැකිය. වැරදිකරුවන් ආර්ථිකයට දායක වීමටත්, විපතට පත් වූවන්ට වන්දි ගෙවීමටත් හා සිරකරුවන් හා ඔවුන්ගේ පවුල් එකතු වීමටත් ඉඩ සැලසීම.

### *දුර්වලතා*

- එළඹුනු සම්මුතීන්, පාර්ශ්වයන්ගේ හෙට්ටු කිරීමේ අසමාන ශක්තීන් පෙන්නුම් කරයි. පවතින සමාජ ආකල්පයන් ඇත්තෙන්ම ස්ත්‍රී පුරුෂ භාවය, වයස හා වෙනත් තත්වයන් පදනම් කරගෙන අසමානතාවයන් තහවුරු කළ හැකිය.
- ක්‍රියාවලියට නායකත්වය දෙන අය සමහර කණ්ඩායම් කෙරේ පක්ෂපාතී විය හැකිය.
- ක්‍රියාපටිපාටීන්ගේ නම්‍යතාවය නිසා ක්‍රියාපටිපාටි ආරක්ෂාවන් ප්‍රමාණවත් නොවිය හැකි ය.

## 8 සත්‍යය පැවසීම

**සත්‍ය සෙවීමේ කොමිසමේ සභාවලට අතීතයෙන් විධිමත් ලෙස වෙන් වීමත්, වඩා විවෘත සාමකාමී හා ප්‍රජාතන්ත්‍රවාදී අනාගතයක් කරා පරිවර්තනය වීමත් සංඥා කළ හැකිය.**

සත්‍ය සෙවීමේ කොමිසම් සම්බන්ධයෙන් සමහරවිට ඉතා වැදගත් විශේෂත්වය වන්නේ පුද්ගල සමගි සන්ධානයක් ජාතික හෝ දේශපාලන සමගි සන්ධානයක් අතරය. සත්‍ය සෙවීමේ කොමිසම් දෙවැනි කාරණය ගැන අවධානය යොමු කරන නමුත් වක්‍ර ආකාරයකින් පළමු කාරනයට උදව් වේ. සත්‍යය, සමගි සන්ධානය සෙවීමේ බොහෝ දේ අතර එකක් වුව ද ඉතා වැදගත් කරුණකි.

### සත්‍යය සෙවීමේ ක්‍රම/මෙවලම්

අද පරිවර්තන සමාජයන් සත්‍ය සෙවීමේ කොමිසම් පිහිටුවන බව පැහැදිළි සත්‍යයකි. එහෙත් සත්‍ය සෙවීමේ කොමිසම් අධිකරණ විභාගවලට ආදේශකයක් නොවේ. ඒවා අධිකරණමය ආයතනමය නොවන හෙයින් ඇත්තේ උසාවි වලට වඩා අඩු බලයකි. මානව හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ සත්‍යය සෙවීමේ තවත් පරීක්ෂණ ක්‍රම තුනක් අඩුම වශයෙන් හඳුනා ගත හැකිය. ඉන් වඩාත් උචිත ක්‍රමය රඳා පවතින්නේ පවතින තත්වය මතය. සමහර රටවල ආණ්ඩු ඓතිහාසික කොමිසම් පිහිටුවා ඇත. ඒ වසර ගණනාවකට පෙර සිදු වූ අයථා කටයුතු පිළිබඳව දැන් කෙරෙන පරීක්ෂණයයි. ඒවා පිහිටුවා ඇත්තේ දේශපාලන පරිවර්තනයේ කොටසක් වශයෙන් නොවන අතර ඒවා වත්මන් දේශපාලන නායකත්වයට හෝ භාවිතාවන්ට අයත් වන්නේ නැත. පසුගිය මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව සමහර නිල හෝ අර්ධ නිල පරීක්ෂණ සත්‍ය සෙවීමේ කොමිසම් වල ප්‍රධාන ගති ලක්ෂණ තිබුනත් ඒවා දේශපාලන ක්‍රියාකාරකම්වලින් එතරම් ස්වාධීන වන්නේ නැත. එහි විෂය පථය හෝ අධිකාරියත් සීමිත වන අතර එය වැදගත් වන්නේ සම්පූර්ණ සත්‍ය සෙවීමේ කොමිසමට පුරෝගාමී කටයුත්තක් වශයෙනි. එමෙන්ම කලින් පැවති රාජ්‍ය පාලනයන් යටතේ සිදු වූ උල්ලංඝනය කිරීම හා අයථා වැඩ කටයුතු ලේඛනගත කිරීම සඳහා රාජ්‍ය නොවන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන්නේ සමහර විට පල්ලියේ සහාය ද ඇතිව ජාතික මානව අයිතිවාසිකම් සංවිධාන මගිනි. සමහර විට ඉන් අගනා ප්‍රතිඵල ලැබී ඇත.

## සත්‍යය සෙවීමේ කොමිසම යනු කුමක්ද?

**සාමාන්‍යයෙන් සත්‍යය සෙවීමේ කොමිසම යනු:**

- වසරක් දෙකක් ක්‍රියාත්මක වන තාවකාලික ආයතනයයි.
- රජයක් විසින් ද සමහර විට සන්නද්ධ විපක්ෂ කණ්ඩායමක් විසින් ද, එමෙන් ම සාම ගිවිසුම අනුවත් නිල වහයෙන් අනුමැතිය ලත්, බලය ලත් හෝ බලාත්මක වූ,
- අයිතියක් වශයෙන්ම කිසියම් ස්වාධීනත්වයක් උසුලන අධිකරණය නොවූ ආයතන
- සාමාන්‍යයෙන් පිහිටුවනු ලබන්නේ යුද්ධයෙන් සාමයට හෝ ඒකාධිපති පාලනයකින් ප්‍රජාතන්ත්‍රවාදයට දේශපාලන වශයෙන් පරිවර්තනය වීමේ අවස්ථාවක දී ය.
- අතීතය කෙරේ අවධානය යොමු වේ.
- එක් විශේෂිත සිද්ධියක් නොව කාලයක් තිස්සේ සිදු කරන ලද අයථා කටයුතු හා විශේෂිත උල්ලංඝනය කිරීම් වල ආකාරයන් විමර්ශනය කෙරෙහි යොමු වේ.
- ඔවුන්ගේ කාර්ය සම්පූර්ණ වන්නේ නිගමන සහ නිර්දේශ ඇතුළත් අවසාන වාර්තාවක් ඉදිරිපත් කිරීම සහ
- මානව අයිතිවාසිකම් උල්ලංඝනය සහ සමහර අවස්ථාවල දී මානව හිතවාදී මිණුම් පිළිබඳව අවධානය යොමු වේ.

## අත්විය හැකි වාසි

සත්‍ය සෙවීමේ කොමිසම්වලින් වාසි කීපයක් අත්විය හැකිය.

- ***අතීතය පිළිබඳව සත්‍යය තහවුරු කිරීමට ඉවහල් වේ:*** ඔවුන්ට නිවරදි සවිස්තරාත්මක, අපක්ෂපාත හා නිල වාර්තාවක් ස්ථාපනය කිරීමටත්, අනෙක් ඒක පාක්ෂික වාර්තාවලට අභියෝග කිරීමටත් ප්‍රචණ්ඩ අතීතයේ සැබෑ පරිමාව හා බලපෑම ගැන මහජනතාවගේ අවබෝධය නංවාලීමටත් හැකිය.
- ***මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නන්ගේ වගකීම පුළුල් කෙරේ:*** සාක්ෂි එකතු කිරීමෙන් සංවිධානය කිරීමෙන් හා ආරක්ෂා කිරීමෙන් අපරාධ පිළිබඳ චෝදකයින්ගේ කාර්යයන්ට ඌන පූර්නයක් විය හැකිය. ඔවුන්ට සිවිල් වගකීම, තනතුරුවලින් ඉවත් කිරීම, හානි පූර්ණය හෝ ප්‍රජා සේවා යෝජනා ක්‍රම වැනි සිර දඬුවම් නොවන වගකීමේ ආකාරයන් නිර්දේශ කළ හැකිය.
- ***විපතට පත්වූවන් සඳහා මහජන වේදිකාවක් සපයයි:*** විපතට පත් වූවන් සුවපත් කිරීමට උදව් දීමෙන්, ඔවුන්ගේ අරමුණුවලට සහයෝගය දීමෙන්, පෞද්ගලික නිදොස් වීමේ හැඟීමක් ඇති කිරීමෙන් හා අතීත අපරාධ පිළිබඳ මානුෂික බලපෑම ගැන දැනුවත් කිරීමෙන් ඔවුන් පරිවර්තන ක්‍රියාවලියේ පෙරමුණටම ගෙන ආ හැකිය.
- ***මහජන සංවාදය දැනුවත් කිරීම හා ශක්තිමත් කිරීම:*** පරිවර්තන ක්‍රියාවලියේ දී විසඳිය යුතු සදාචාරමය දේශපාලන හා නෛතික කරුණු පිළිබඳ මහජන කතිකාවතක් ඇති කිරීමට ඔවුන්ට උදව් විය හැකිය.
- ***විපතට පත් අය සඳහා හානි පූර්ණයක් නිර්දේශ කිරීම*** **:** ඔවුන්ට

අතීත අයථා කටයුතු වලටත්, දැනට සිදුවෙමින් පවතින මානසික, ශාරීරික හා ආර්ථික හානි වලටත්, හානි පූර්ණයක් කිරීමට පෙළඹවීමටත් එවැනි කාර්යයන් සඳහා විපතට පත් අය යන්න පිළිබඳව සාධාරන හා ඵලදායි නිර්වචනයක් හා කාණ්ඩ කිරීමක් සිදු කිරීමටත් පුළුවන.

- *අවශ්‍ය ආයතනික හා නෛතික ප්‍රතිශෝධන නිර්දේශ කළ හැකිය*: ඔවුන්ට මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පැහැදිළි සාක්ෂි ඉදිරිපත් කළ හැකි අතර නෛතික හා ආයතනික ප්‍රතිශෝධන නිර්දේශ කළ හැකිය.

- *සමගි සන්ධානය ප්‍රවර්ධනය කළ හැකිය*: ඔවුන්ට ගැටුමට මැදි වූ පාර්ශ්වයන්ට එකිනෙකාගේ දුක් ගැනවිලි හා වේදනා ඇසීමට සැලැස්වීමෙන් ඉවසීම හා අවබෝධය ප්‍රවර්ධනය කළ හැකිය. දුක් ගැනවිලි විසඳීම සඳහා මැදිහත් වීමට හා විසඳීමට ආරක්ෂාකාරී හා අපක්ෂපාතී මණ්ඩලයක් ලබා දිය හැකිය. ඔවුන්ට වැරදිකරුවන් නැවත සමාජයට ඇතුළත් කර ගැනීම සඳහා පියවර නිර්දේශ කළ හැකිය.

- *ප්‍රජාතාන්ත්‍රික පරිවර්තනයක් ශක්තිමත් කිරීමට උදව් වීම*: ඔවුන්ට ඉහත සඳහන් සියළු මාර්ගයන් තුළින් අතීතයෙන් විධිමත් බෙදීමක් හා වඩාත් සාමකාමී විවෘත හා ප්‍රජාතාන්ත්‍රිය අනාගතයක් සඳහා වන පරිවර්තනය සහ තම අරමුණ ප්‍රජාතාන්ත්‍රිය ක්‍රියාවලියෙන් බැහැරව ලබා ගැනීමට ක්‍රියාත්මක වන අය දුර්වල කිරීම සනිටුහන් කළ හැකිය.

## සත්‍යය සෙවීමේ කොමිසම් හැම විටම භාවිතා නොකිරීමට හේතු

- *සිදුවෙමින් පවතින හෝ ප්‍රචණ්ඩත්වය හෝ බිය*: යුද්ධයක් පිළිබඳ බිය පැරණි අපරාධ හා කුචාල නැවත මතු කිරීම නිසා ප්‍රචණ්ඩත්වය නැවත මතු වී යුද්ධය නැවත ඇතිවිය හැකි යැයි හැඟීමක් ඇත.

- *සිදුවෙමින් පවතින ගැටුම්* : කියුණු සන්නද්ධ ගැටුම් පවතින විට මධ්‍යස්ථභාවයක් ඇති කිරීම හා සාක්ෂිකරුවන්ගේ හා විපතට පත් අයගේ සහභාගීත්වය හා ආරක්ෂාව තහවුරු කිරීම හෝ සියළුම සහභාගිකයන්ට විශ්වාසදායක හා සමාන ප්‍රවේශයක් ලබා ගැනීම කිසිසේත් කළ නොහැකි විය හැකිය.

- *දේශපාලන චුවමනාවක් නොවීම* : සත්‍ය සෙවීමට දේශපාලන නායකත්වයේ උනන්දුව හීන වීම හෝ නොමැති වීම හා වැදගත් රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ බලපෑමක් නොවීම.

- *වෙනත් වැදගත් ප්‍රමුඛතා* : මහත් විනාශයකින් පසුව ජීවත් වීම හා නැවත ගොඩ නැගීම පිළිබඳ අවධාරණය යොමු කිරීමේ පුළුල් අපේක්ෂාවක් තිබීම.

- *ප්‍රමාණවත් හැකියාවක් නොවීම* : සම්පත් නොවීම හා මූලික ආයතනික ව්‍යුහයක් නොමැති වීම.

- *විකල්ප යාන්ත්‍රණයන් හා මනාප* : පැරණි අපරාධ නැවත මතු කිරීමට ජාතික සංස්කෘතිය අනුව ඉඩක් නොවීම හා පවතින ප්‍රජා මූලික යාන්ත්‍රණයන් ප්‍රචණ්ඩත්වයට වඩා හොඳින් ප්‍රතිචාර දක්වීම.

මේ සියල්ල පරිවර්තනය වන සමාජයන් රජයෙන් සිදු කරන සත්‍ය සෙවීම අතහැර දැමීමටත්, ඒ වෙනුවට රාජ්‍ය නොවන යාන්ත්‍රණයන් කෙරේ වැඩි මනාපයක් දක්වීමටත් හේතුන් විය හැකිය. ප්‍රමාණවත් මහජන සංවාදයක් හෝ කිසිම සංවාදයක් නොමැතිව සත්‍යය නොසෙවීමට රජයෙන් හෝ අතීතය ගැන පරීක්ෂා කිරීම වැලැක්වීමට

උනන්දුවක් දක්වන අය හෝ ගන්නා ඕනෑම තීරණයක් සෑහෙන සැකයකින් සැළකිල්ලට ගත යුතුය.

## ඇතිවිය හැකි අනතුරු

- ***නොමනා අරමුණු*** : රජයක් දේශපාලන පලි ගැනීම් සිදු කිරීමට හෝ අසීරු කාර්යයන් සඳහා තමන්ගේම වගකීම් මග හැරීමට සත්‍ය සෙවීමේ කොමිසම යොදා ගැනීමට අරමුණු කර ගනු ලැබුවා විය හැකිය. කොමිසම සිතාමතාම දුර්වල කොට පසුව එහි ප්‍රතිඵල ලෙහෙසියෙන් අභියෝග කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අදහස් කරනු විය හැකිය. වංක රජයක් සත්‍යය සෙවීමේ කොමිසම අතීතය නිවැරදි කිරීමට ප්‍රමාණවත් දෙයක් කලේ නැති බවට විපතට පත් අයගෙන් නැගෙන විවේචනයන්ගෙන් ආරක්ෂා වීම සඳහා යොදා ගැනීමට ද ඉඩ ඇත.
- ***පක්ෂග්‍රාහිත්වය*** : කොමසාරිස්වරුන් පක්ෂග්‍රාහීව ක්‍රියා කළ හැකිය. එවිට අරමුණක් ඇතිව ක්‍රියා කිරීමත් අතීතය ගැන සම්පූර්ණ විස්තරයක් ලබා ගැනීමත් කළ නොහැකි වනු ඇත.
- ***යථාර්තවාදී නොවන බලාපොරොත්තු:*** කොමිසම් සහා විපතට පත් අය හා මහජනතාව තුළ යථාර්ථවාදී නොවන බලාපොරොත්තු ඇති කළ හැකිය. ඉන් නැවතත් බලාපොරොත්තු කඩ වීම හා තව දුරටත් අසහනය ඇති කිරීමක් සිදු විය හැකිය.

මෙම අනතුරු බොහොමයක් ප්‍රබල සිවිල් සමාජයක හා ස්වාධීන මාධ්‍යයක බලපෑමෙන් අඩු කළ හැකිය. ඒවා නොපවතින්නේ නම්, අවංකවම සත්‍ය සෙවීමේ කොමිසමක් පත් කළ යුතු යැයි පවසන අය, එවැනි අනතුරු පවතින බව කලින්ම අවබෝධ කර ගත යුතුය.

## දේශපාලන සන්දර්භය

ආයතනවලට හා කොමිසමක ක්‍රියාකාරිත්වයට බලපාන පරිවර්තන සන්දර්භයකින් ද සාධක පැන නගී. සාර්ථක කොමිසමක් සහතික කිරීමේ තීරණාත්මක අංග ලක්ෂණ වනුයේ මහජන හිමිකම හා ක්‍රියාත්මක සහභාගිත්වයයි.

### සීමා කෙරෙන සාධක

- බොහෝ දේශපාලන පරිවර්තන කියුණු සාකච්ඡා වල ප්‍රතිඵලයක් වන අතර, එය රඳා පවතින්නේ රජයේ විධිමත් පාලනය ලබා ගැනීම සඳහා ක්ෂමාව ලබා දීම යනාදියට ඇති විරුද්ධත්වය මතයි.
- ඉවත්ව යන පාලනය මගින් බොහෝ විට පුළුල් වශයෙන් අපරාධ පිළිබඳ සාක්ෂි විනාශ කිරීමට ද හැකිය.
- සාක්ෂි දීම පිළිබඳව මහජනතාව තුළ (පෞද්ගලිකව බිය වැද්දීම වැනි දේ නිසා) බියක් ඇති විය හැකිය. එය කොමිසමට සත්‍යය සොයා ගැනිමට බාධාවක් විය හැකිය.
- අධිකරණමය පරිපාලනයේ දුර්වලතා හෝ දූෂණ නිසාත් පොලීසියේ හෝ හමුදාවේ සහයෝගය ප්‍රමාණවත් නොවීම නිසාත් මෙම කාර්ය ඉටු නොවිය හැකිය.
- කොමිසමේ විභාග නිසා දුර්වල තත්වයෙන් වන හමුදාව විසුරුවා හැරීම, නිරායුධකරණය හා නැවත සමාජයට ඇතුළත් කර ගැනීම අඩපණ වනු ඇතැයි බොහෝ විට පුළුල්ව පැතුරුණු බියක් ද පවතී.

### සාධනීය සාධක

- සත්‍ය සෙවීමේ කොමිසමක් ස්ථාපනය කිරීමට ප්‍රබල මහජන සහයෝගයක් පැවතීම.

- උද්යෝගිමත් හා බැඳීමකින් යුතු සිවිල් සමාජයක් පැවතීම (විශේෂයෙන්ම, ශක්තිමත් විපතට පත් වූවන්ගේ කණ්ඩායම්, ආගමික නායකයින් හා බුද්ධිමතුන් වැනි)
- අයථා ක්‍රියාවන්ගෙන් විපතට පත් වූවන් සමග පුළුල් සමාජ අනන්‍යතාවය
- විවේචනාත්මක, නිදහස් මාධ්‍යය
- නිරන්තර ජාත්‍යන්තර අවධානය හා බලපෑම්

## සංයුතිය

**කොමිසමේ සාමාජිකයින් සංවාදාත්මක ක්‍රියාවලියක් තුළින් තෝරා ගන්නේ නම් හා සාධාරණ සමබරතාවයක් තහවුරු කිරීමට අවංක උත්සාහයක් ගන්නේ නම් පුළුල් මහජන සහයෝගයක් හා අන්තර් ජාතික සහයෝගයක් ලබා ගත හැකිය.**

සත්‍ය සෙවීමේ කොමිසමක් කළමණාකරණය සඳහා තෝරා ගන්නා පුද්ගලයින් අවසානයේ දී එහි සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය තීරණය කරණු ඇත. කොමිසම් ගණනාවක් ගැටළුවලට ලක් වූයේ කොමසාරිස්වරුන්ගේ දුර්වල කළමණාකාරීත්වය නිසාය. කොමසාරිස්වරුන් සාමාන්‍යයෙන් කොමිසමේ එදිනෙදා පරිපාලනයට මැදිහත් නොවුවත්, පරීක්ෂණ මෙහෙයවීමෙන්, කොමිසමේ ප්‍රතිපත්ති හැඩ ගසන්නේත් අවසාන වාර්තා පිළිබඳ අන්තිම වගකීම දරන්නේත් ඔවුන් ය. කොමිසමේ මහජන පිළි ගැනීම සම්බන්ධයෙන් බලන විට කොමසාරිස්වරුන්ගේ පෞද්ගලික හා දේශපාලන අධිකාරිය විරෝධාකල්පයෙන් යුත් අධිකාරින් සමග ගනුදෙනු කිරීමේ දී තීරණාත්මක විය හැකිය. කොමිසමේ සාමාජිකයින් සංවාදාත්මක ක්‍රියාවලියක් තුළින් තෝරා ගන්නේ නම් හා දේශපාලන මත හා වාර්ගික හා ආගමික කණ්ඩායම් නියෝජනයේ සාධාරණ සමබරතාවයක් තහවුරු කිරීමට අවංක උත්සාහයක් ගන්නේ නම් පුළුල් මහජන සහයෝගයක් හා අන්තර් ජාතික සහයෝගයක් ලබා ගත හැකිය.

## පවරනු ලැබූ විධානය හා බලය

- *අරමුණු* : පත් කිරීමේ කොන්දේසිවල ප්‍රධාන අරමුණු දක්විය යුතුය. අතීතය පිළිබඳ සත්‍යය තහවුරු කිරීම, ජාතික සමගි සන්ධානයට දායක වීම, විපතට පත් වූවන්ට උදව් වීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම හා නැවතත් යුද්ධය ඇති වීමට හෝ ඒකාධිපති පාලනය ඇති වීම වැළැක්වීම.
- *ක්‍රියාත්මක කාල පරිච්ඡේදය* : කෙටි කාලීන දීර්ඝ කිරීම්වලට ඉඩ සැලසෙන සේ ආරම්භක හා අවසාන දින නම්‍ය විය යුතුය. කෙසේ වුවත් ක්‍රියාත්මක වන සම්පූර්ණ කාලය ස්ථිර විය යුතුය. නොඑසේනම් කොමිසම දීර්ඝ කාලයක් දිග්ගැස්සීමට ඉඩ ඇති අතර අවධානය නැති වීමටත් අවසානයේ දී මහජන උනන්දුව ගිලිහී යාමටත් පුළුවන. වසර 1-2 අතර කාලයක් වඩාත් යෝග්‍ය ය.
- *පරීක්ෂණයට භාජනය වන උල්ලංඝනය වීම්වල ආකාරයෙන්:* ඇත්තෙන්ම කොමිසමේ කාර්ය වන්නේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පරීක්ෂා කිරීම වුව ද, එක කොමිසමකින් කෙටි කාලයක් තුළ දී අර්ථාන්විත ආකාරයකින් විමසිය නොහැකි තරම් වූ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වල විවිධ ආකාරයන් ඇත.
- *විමසීමට ලක්වන කාල පරිච්ඡේදය:* මෙය ආරම්භයේ දීම පැහැදිළි විය යුතුය. එය බොහෝ විට මත භේදයට තුඩු දේ. කාල සීමාව බොහෝ විට අදාළ වන්නේ ඉතිහාසයේ ඉතාමත් නරක හෝ අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වැඩිම සංඛ්‍යාවක් සිදු වූ කාල පරිච්ඡේදයක් වන අතර එය බොහෝ විට සිවිල් යුද්ධ හෝ ඒකාධිපති පාලන කාල සීමාවකි.

- ***කොමිසමේ කාර්යයන්*** : කොමිසම තම අරමුණු ළඟා කර ගන්නා මූලික කාර්යන්ට අයත් වනුයේ එහි විධානය ප්‍රචාරය කිරීම, සමීක්ෂණ හා පරීක්ෂා සිදු කිරීම හා තම සොයා ගැනීම් හා නිර්දේශ ඇතුළත් අවසාන වාර්තාව ඉදිරිපත් කිරීමයි.

- ***බලතල*** : අවම වශයෙන් කොමිසමට අදාළ තොරතුරු ලබා දිය හැකි අය සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීමට මහජන ආයතනවල සම්පූර්ණ සහයෝගය ලබා ගැනීමට හා අවශ්‍ය ක්ෂේත්‍ර චාරිකාවල (බොහෝ විට කලින් නොදන්වා) යෙදීමට හැකියාව තිබිය යුතු ය. කොමිසමට සාමාන්‍යයෙන් සිතාසි යැවීමේ, පරීක්ෂා කිරීමේ හා භාරයට ගැනීමේ බලතලත්, සමහරවිට සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ බලයත් පැවරේ. මෙවැනි බලතල පැවරීම හොඳින් තුලනය විය යුතුය. සෑම අමතර බලය පැවරීමක් නිසාම මෙම ක්‍රියාවලිය සත්‍ය සෙවීමේ කොමිසමක් වෙනුවට උසාවි ක්‍රියාවලියක් බවට පත් විය හැකිය.

- ***සම්බාධක*** : සහයෝගය නොදක්වන අය කෙරේ සම්බාධක, දඩ, සිරගත කිරීම හෝ ඒ දෙකම පැනවීමට ප්‍රමාණවත් බලතල කොමිසම සතු විය යුතුය.

- ***පසු විපරම*** : කොමිසමේ අවසාන වාර්තාව ප්‍රකාශයට පත් කිරීමටත් එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් රජයට කිසියම් යුතුකමක් පැවරෙන්නේ නම් ඒ මොනවා ද? කොමිසම ක්‍රියාත්මක වීම අවසන් වූ පසු එහි ලිපිගොනු හා වාර්තා ආරක්ෂා කිරීම, අනතුරුව භාවිතා කිරීම හා විගණනය කිරීම ගැන ද සැලකිල්ල යොමු විය යුතුය.

## සම්පත් භාවිතය

ප්‍රමාණවත් සම්පත් සැපයීමක් නොවන්නේ නම් ඉතා හොඳින් සැලසුම් කළ සත්‍යය සෙවීමේ කොමිසමක් වුව ද සාර්ථක වන්නේ නැත. නව කොමිසමක සාමාන්‍ය පිරිවැය ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 5-10 දක්වා ඉහළ ගොස් ඇත. ප්‍රවනතාවය වනුයේ ජාතික රජයේ අරමුදල් සමග ප්‍රදානක රාජ්‍යයන්ගෙන් හා ලැබෙන්නේ නම් පෞද්ගලික අරමුදල් එකට යෙදවීම ය.

## සත්‍යය සෙවීමේ කොමිසමක් ක්‍රියාත්මක කිරීම

### සූදානම් වීමේ කාර්යයන්

- කාර්ය මණ්ඩල සැලස්මක් සැකසීම
- අභ්‍යන්තර නියමයන් හා ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම
- වැඩ සැලසුම් සම්මත කර ගැනීම
- වාර්තා හා දත්ත ගබඩා කිරීම : සංවිධානය කිරීම හා ලබා ගැනීම සඳහා ඵලදායී දත්ත බැංකුවක් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- මූලික පසුබිම් සමීක්ෂණය
- ජාතික හා අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන, එක්සත් ජාතීන්ගේ සංවිධානය, විදේශීය රාජ්‍ය හා වෙනත් මූලාශ්‍ර වලින් පවතින ලිපි ලේඛන රැස් කිරීම.
- මහජනයා දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් සැලසුම් කිරීම
- අරමුදල් රැස් කිරීම හා අයවැය සකස් කිරීම

### සත්‍යය සෙවීමේ කොමිසමක ආයු කාලය තුළ සිදුවන ප්‍රධාන ක්‍රියාකාරකම්

- ***ව්‍යාප්ත වීම*** : සත්‍යය සෙවීමේ කොමිසමක් මහජනතාව අතරට යෑම අතිශයින්ම වැදගත් වන අතර, තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව, අවශ්‍යතාවයන් විසඳා ගැනීමේ හැකියාව හා මහජන අපේක්ෂාවන් කළමණාකරණයේ හැකියාව හා මහජන ප්‍රසාදය කෙරේ ගැඹුරු ලෙස බලපායි. මහජනයා දැනුවත් කිරීම කොමිසමේ භූමිකාව හා විධානය පැහැදිළි කෙරෙන

මහජන රැස්වීම්, ප්‍රකාශන පත්‍රිකා, වීඩියෝ දර්ශන යනාදියෙන් සිදු කළ හැකිය.

- ***කට උත්තර සටහන් කිරීම*** : බොහෝ තොරතුරු කාර්ය මණ්ඩලය විසින් එක් එක් විපතට පත් වූවකුගෙන් පෞද්ගලික මුණ ගැසීම්වල දී කට උත්තරයක ආකාරයෙන් සටහන් කර ගැනේ.
- ***ප්‍රකාශන සටහන් කර ගැනීම*** : අතීතය පිළිබඳ සත්‍යය සෙවීමේ ඉලක්කයට වඩාත් සමීප වන අතරම විපතට පත් වූවන්ට තම චිත්ත වේගාත්මක අත්දැකීම් අනුකම්පා සහගත හා ආරක්ෂාකාරී පරිසරයක් තුළ නැවත කීමේ අවස්ථාවක් ද වේ. විපතට පත් වූවන් හා සාක්ෂිකරුවන් බොහෝ දෙනෙකුට ප්‍රකාශ සටහන් කර ගන්නන් ඔවුන් කොමිසම සමග පවත්වන එකම සම්බන්ධතාවය වන නිසා එය සාක්ෂිකරුවන්ට හා ප්‍රජාවන්ට විශේෂ වැදගත්කමකින් හා බැඳීමකින් යුතු වනු ඇත.
- ***සමීක්ෂණ හා පරීක්ෂණ*** : සමීක්ෂණ ඒකකය හා පොලීසියේ වැනි පරීක්ෂණ ඒකක විශාල අය වැය හා ශක්තිමත් විධානයන්ගෙන් යුත් සත්‍යය සෙවීමේ කොමිසම්වල ව්‍යුහය වී ඇත. බොහෝ කොමිසම් සභා සමීක්ෂණය හා පරීක්ෂණය එකම දෙපාර්තමේන්තුවක් යටතට පත් කරයි.
- ***දත්ත සැකසීම*** : සත්‍යය සෙවීමේ කොමිසම් සභා ඉමහත් තොරතුරු ප්‍රමාණයක් පරිහරණය කරති. ඊට ගබඩා කිරීම, සංවිධානය හා ආපසු ලබා ගැනීම සඳහා පළදායී දත්ත බැංකුවක් අවශ්‍යය. ශක්තිමත් දත්ත කළමණාකරණ පද්ධතියක් වැදගත් ඓතිහාසික රටාවන් විග්‍රහ කිරීමේ සමස්ත චිත්‍රයක් ඇති කර ගැනීමට ඉවහල් වේ.
- ***ප්‍රසිද්ධ සාක්ෂි විභාග*** : මෙය සාපේක්ෂ වශයෙන් මෑතක වූ වර්ධනයකි. ප්‍රසිද්ධ සාක්ෂි විභාග පැවැත්වීම සඳහා ප්‍රබල තර්ක ඉදිරිපත් වේ. විපතට පත් අයට හා ඉන් ගැලවුන අයට තම කතන්දරය මහජනයා ඉදිරියේ පැවසීමට අවස්ථාවක් ලබා දීමෙන් කොමිසමට විධිමත්ව තම වැරදි පිළි ගැනීමටත්, විපතට පත් වූවන් සඳහා මහජන අවබෝධය හා අනුකම්පාව ලබා දීමටත්, සමාජයේ සමහර කොටස් සත්‍යය පිළි නොගැනීම අඩු කිරීමටත්, තම වැඩකටයුතුවලට විවෘත භාවයක් ලබා දීමටත් පුළුවන. ප්‍රසිද්ධ සාක්ෂි විභාග මගින් අතීතය පිළිබඳව සැබෑ මහජන සාකච්ඡාවක් දිරිමත් කිරීමෙන් සත්‍යය සෙවීමේ කොමිසමේ අවධානය එහි නිෂ්පාදිතය (අවසාන වාර්තාව) කෙරේ වෙනුවට එහි ක්‍රියාවලිය කෙරේ යොමු කිරීමට ඉවහල් වේ. එහෙත් කොමසාරිස්වරුන්ගේ සහ විපතට පත් අයගේ ආරක්ෂාව, කාලය හා සම්පත් පිළිබඳ සීමාවන් හා කොමිසමේ ක්‍රියා පටිපාටිය 'උසාවියක්' බවට පත් කිරීමේ අනතුර නිසා සාක්ෂි විභාග රහසේ පැවැත්විය යුතු යැයි ද මතයක් පවතී.
- ***චිත්ත භාවාත්මක සහයෝගය*** : විපතට පත් වූ සමහරුන්ට සත්‍යය සෙවීමේ කොමිසම ඉදිරියේ තම අත්දැකීම් පැවසීම එම චිත්ත පීඩාව නැවත විඳීමක් විය හැකිය. මෑතක සිට සත්‍යය සෙවීමේ කොමිසම් සභා මෙම තත්වයෙන් ආරක්ෂා වීමේත් ඊට මුහුණ දීමේත් වැදගත්කම අවබෝධ කරගෙන ඇත.
- ***අවසාන වාර්තා*** : මෙය බොහෝවිට කොමිසම් සභාවල කල් පවත්නා දායාදයක් වන නිසා එය මානව අයිතිවාසිකම් අධ්‍යාපනයට මෙන්ම නඩු පැවරීමේදී ද යොදා ගත හැකිය. අනෙකුත් අයට මෙම බලය පැහැදිළිව ලබා දී නොමැති වුවත් පුද්ගලයන් නම් කිරීමේ වක්‍ර මාර්ග සොයා ගැනීමට තරම් නිර්මාණශීලී ය. මෙම කරුණ මත හේදයට තුඩු දුන් එකකි. මෙම නොඑකඟතාවය පවතින්නේ එකිනෙකට පටහැනි මූල ධර්ම දෙකක් පදනම් කරගෙන ය. එකක් වන්නේ,

- ***නිසි ක්‍රියා පිළිවෙල (due process)*** අනුව අපරාධයක් පිළිබඳව චෝදනා එල්ල වී ඇති පුද්ගලයෙකු වැරදිකරු බව ප්‍රකාශ කිරීමට පෙර ඔහුට තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දිය යුතු ය. දෙවැනි මූල ධර්මය වන්නේ සම්පූර්ණ සත්‍යය පැවසීමේ දී තම සම්බන්ධතාවය ගැන පැහැදිලි සාක්ෂි තිබෙන විට එබඳු පුද්ගලයින් නම් කිරීමේ වගකීමක් ද වීමය. ඉතාම හොඳ ක්‍රමය වන්නේ පුද්ගලයින් නම් කළ යුතු ද යන්න තීරණය කිරීමට කොමිසම් සභාවලට පැවරීමත් අවසානයේ දී එසේ නම් කළ යුතු ද නැද්ද යන්න තීරණය කිරීමට ඔවුන්ටම අවස්ථාවක් ලබා දීමත් ය. පුද්ගලයින්ගේ නම් සඳහන් නොකිරීම සඳහා වලංගු හේතු ගණනාවක් පැවතිය හැකිය. කොමසාරිස්වරුන්ගේ විපතට පත් අයගේ හෝ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාවට ඇති තර්ජන, ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම හෝ චෝදනාලත් අයට විධිමත් දැනුම් දීම හෝ ආරක්ෂාව ලබා දිය නොහැකි අවස්ථාවල දී ය. කොමසාරිස්වරුන් අපරාධය සිදු කළ අයගේ නම් සඳහන් නොකිරීමට තීරණය කරන්නේ නම් ඒ සඳහා දේශපාලන, සදාචාරමය හා නෛතිකව ඇති හේතු සාධක දැක්විය යුතුය. ඔවුන් නම් සඳහන් කරන්නේ නම් තම කරුණු දැක්වීම නෛතික හෝ සාපරාධී මට්ටමේ එකක් නොවන බව ද පැහැදිලිව දැක්විය යුතු ය.
- ***එය සිදු කළ අය ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම*** : අතීත කොමිසම් සභා වැරදි සිදු කළ අයගෙන් අර්ථාන්විත සහයෝගයක් ලබා ගැනීමට අසමත් වූහ. ඊට වෙනස් වන්නේ පුද්ගලයින්ට ක්ෂමාව ලබා දීමේ බලය තිබුණු දකුණු අප්‍රිකානු සත්‍යය සෙවීමේ කොමිසම පමණි. එවැනි සත්‍යය සඳහා ක්ෂමාව වැනි සූත්‍රයකින් අසීරු දේශපාලන, නෛතික හා සදාචාරමය කරුණු මතු කෙරේ.
- ***පසු විපරම් ප්‍රයත්න*** : සත්‍ය සෙවීමේ කොමිසම් එහි අවසාන වාර්තාව භාර දුන් පසු ලිපි ගොනු ආරක්ෂිතව ගබඩා කොට විධිමත්ව විසුරුවා හරී. එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම පැවරෙන්නේ අනෙක් අයට ය. අවාසනාවකට මෙන්, රජයකට ඒවා ක්‍රියාත්මක කිරීමේ නීත්‍යානුකූල වගකීමක් පැවරී ඇති විට ද සිදුවන ප්‍රධාන අඩුපාඩුවකි. ඊට හේතුව විය හැක්කේ ප්‍රමාණවත් දේශපාලන ඕනෑකමක් නොමැතිවීම හෝ ප්‍රමාණවත් ආයතන හැකියාවක් හෝ අරමුදල් නොමැති වීම විය හැකිය. හේතුව කුමක් වුවත්, සත්‍යය සෙවීමේ කොමිසම විධිමත් නිරීක්ෂණ හා පසු විපරම් සඳහා සුදුසු යාන්ත්‍රනයක් ද යෝජනා කළ යුතු ය.

සත්‍යය සෙවීමේ කොමිසම, ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් හා නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කිරීමටත් අපේක්ෂා කරන පරිවර්තන තත්වයේ පවතින රටවලට ඇති එක යාන්ත්‍රණයක් පමණි. පරීක්ෂා කිරීමේ වැඩසටහන්, නීති ප්‍රතිශෝධන, විපතට පත් අයට හානි පූර්ණය, දේපළ ආපසු භාර දීමේ හා නැවත සම්බන්ධ කර ගැනීමේ පියවර යනාදිය පරිවර්තන සාධාරණ වැඩසටහන් මාලාවක කොටස් කීපයකි. මෙම පරිවර්තන යුගයේ සාධාරණත්වයේ විවිධ අංග එකට අතුළත් කිරීමේ හෝ සංකලනය කිරීමේ නව ප්‍රවනතාවයක් ද දක්නට ලැබේ.

## 9 හානි පූර්ණය

**හානි පූර්ණය අතීතය හා අනාගත අතර පාලමක් සේ ක්‍රියා කරයි. එය විපතට පත් වූවන්ට වන්දි ගෙවීමේ අරමුණෙන් පසුපස බැලීමක් ද, දේශපාලන ප්‍රතිශෝධනය කිරීමේ අරමුණෙන් ඉදිරි බැලීමක් ද එකට බද්ධ කරයි.**

පරිවර්තන යුක්තිය, හානි පූර්ණ අදහස නැවත හැඩ ගස්වා ඇත. මෙම සංකල්පය

යොමුව තිබුනේ වන්දි ගෙවීමට සහ අතීතයට ය. එහෙත් අද ඊට වැදගත් සංකේතාත්මක හා අනාගතයට යොමු වූ පියවර ද ඇතුළත් ය. හානි පූර්ණය කිරීමේ මූලික ආකාරයන් හතරක් ඇත.

- ***හානි පූර්ණ අයිතිවාසිකම් හා ප්‍රතිපත්ති:*** මෙහි දී විපතට පත් අයට ජාතික හෝ/සහ අන්තර් ජාතික නීතිය අනුව ඉල්ලීම් කළ හැකිය. එය හාණි පූර්ණ ප්‍රතිපත්ති සංවර්ධනයට ද යොමු විය හැකිය.

- ***පෞද්ගලික හා සාමූහික පියවර*** : පෞද්ගලික පියවර, පෞද්ගලිකව විපතට පත් අයගේ කරුණු සළකා බලන නමුත් එය කිසියම් කණ්ඩායමකට අයත් වීම නිසා සම්පූර්ණ වර්ගය, ආගමික හෝ වෙනත් කණ්ඩායම් පීඩාවට පත් වූ අවස්ථාවල ඔවුන් සාමූහික හානි පූර්ණ පියවර (නිදසුන් වශයෙන් වෛද්‍ය සේවාවන්, අධ්‍යාපනය හා රැකියාව වැනි දේ) වලින් ඌණ පූර්ණය විය යුතුය.

- ***මූල්‍ය හා මූල්‍ය නොවන පියවර*** : මූල්‍යමය වශයෙන් වන්දි ගෙවීම ඉතාමත් පැහැදිලි හානි පූර්ණය කිරීමක් වුව ද එය බොහෝ විට (සම්පත්වල සීමිත බව නිසා) මූල්‍යමය නොවන පියවරවලින් ඌන පූර්ණය විය යුතුය. පුරවැසිභාවය නැවත ලබා දීම, 'අතුරුදහන් වූ අයට' මරණ සහතික නිකුත් කිරීම, අපරාධ වාර්තා අවලංගු කිරීම, සොහොන් කිරීම හා ගොඩ නැගීම පහසු කරවීම යනාදියයි.

- ***අනුස්මරණ හා ප්‍රතිශෝධන පියවර:*** මෙය පූර්ව ඉතිහාසයේ කෲරත්වය පිළි ගන්නා හෝ පවත්නා ආර්ථික අවාසිය විසඳීමට වර්තමානයේ ගන්නා පියවර ඇතුළත් පසුපස බලන ව්‍යාපෘතීන් විය හැකිය.

## හානි පූර්ණය කරන්නේ ඇයි?

හානි පූර්ණය අතීතය හා වර්තමානය අතර පාලමක් සේ ක්‍රියා කරයි. එය විපතට පත් වූවන්ට වන්දි ගෙවීමේ අරමුණෙන් පසුපස බැලීමක් ද, දේශපාලන ප්‍රතිශෝධනය කිරීමේ අරමුණෙන් ඉදිරි බැලීමක් ද එකට බද්ධ කරයි. නව පශ්චාත් ගැටුම් රාජ්‍යයක් වහාම හානි පූර්ණයට ඇති කැපවීමෙන් තම උනන්දුව පෙන්විය යුතුය. අන්තර් ජාතික නීතිය අනුව කලින් පාලනය විසින් කරන ලද අයථා කටයුතු සම්බන්ධයෙන් අනුප්‍රාප්තික පාලනයක හෝ රජයක ඇති වගකීම ගැන කිසිදු සැකයක් නැත.

හානි පූර්ණය සඳහා ඇති ඉල්ලීම් බොහෝවිට පදනම් වී ඇත්තේ එකිනෙකට වෙනස් එහෙත් අන්‍යොන්‍ය වශයෙන් ශක්තිමක් වන මූලාශ්‍ර දෙකකිනි. සදාචාරමය වශයෙන් යුක්තිය ඉටු කළ යුතු බවටත් හානිය නිවැරදි කළ යුතු බවටත් ඇති මූලික හැඟීම හා නෛතික වශයෙන් ජාතික හා ජාත්‍යන්තර නීතිය අනුවය.

## අධිකරණ හා අධිකරණ නොවන ප්‍රවේශය
## අධිකරණ ප්‍රවේශය

### සීමාවන්

- අධිකරණමය ප්‍රවේශයකින් පූර්ව නිගමනය කරනුයේ මනාව ක්‍රියාත්මක වන අධිකරණ ක්‍රමයක් පැවතීමය. මෙය පශ්චාත් ගැටුම් සමාජයන්හි ඉතා විරල තත්ත්වයකි.

- අපරාධ අධිකරණ ක්‍රමය අයිතිවාසිකම් විශාල වශයෙන් කඩ කිරීම් හෝ එසේ කඩ කරන්නන් ගැන ක්‍රියා කිරීමට හෝ සෘජු හා වක්‍රව විපතට පත් වූවන් අතර ඇති වෙනස පිළි ගැනීමටත් සැළසුම් කර නොමැත.

- අධිකරණමය විසඳුමක් සැළසුම් කොට ඇත්තේ පෞද්ගලික වැරැද්ද ගැන කටයුතු

කිරීමටය. පරිවර්තන සන්දර්භයක් තුළ අපරාධය වඩාත් සංකීර්ණය. එම නිසා පුළුල්, සාමූහික ප්‍රවේශයක් අවශ්‍යය.

- වන්දි ගෙවීමේ කොමිසමක් පුද්ගලයෙකුගේ නෛතික වැරැද්ද තහවුරු කිරීමට බැඳී නොමැති අතර අධිකරණ ක්‍රියාවලියක දී සැකකරුවන්ගේ මානව අයිතිවාසිකම් වලට ගරු කළ යුතුය.
- අධිකරණ ක්‍රියාපටිපාටියක් යටතේ 'සියලු සාධාරණ සැකයෙන් තොරව' ඔප්පු කිරීමේ වගකීම තරමක අසීරු කටයුත්තක් විය හැකිය. අධිකරණමය නොවූ ආයතනයට හානි පූර්ණය කිරීමේදී සැකයේ වාසිය ඉල්ලුම්කරුට ලබා දිය හැකිය.
- අධිකරණමය ප්‍රවේශයක් භාවිතා කිරීමෙන් හානි පූර්ණය සඳහා දායක වීමට ප්‍රතිලාභීන්ගෙන් හා උල්ලංඝනය කිරීම්වලට නෛතික වගකීමක් නොමැති වැරදිකරුවන්ගෙන් ඉල්ලා සිටීම සාමාන්‍යයෙන් අපහසු කාර්යයකි. සමගි සන්ධානය හා එකමුතුකම ප්‍රවර්ධනය කිරීමේ පුළුල් ප්‍රයත්නයක කොටසක් ලෙස, අධිකරණමය නොවන යාන්ත්‍රණයක් තුළින් ප්‍රතිලාභීන් සම්බන්ධ කර ගැනීම වඩාත් පහසුය.
- අධිකරණමය ක්‍රියා පටිපාටීන් භාවිතයේ දී විකල්පයක් නොවන්නේ ක්ෂමාව, මුක්තිය හෝ සීමා කිරීමේ නීති මගින් ප්‍රතිපාදන පූර්වයෙන්ම සලසා තිබීම නිසාය.
- විපතට පත් බොහෝ දෙනෙකුට සිවිල් නඩුවක් ආරම්භ කිරීමට හෝ සාපරාධී නඩු විභාගයකට සහභාගී වීමට හැකියාවන් නොමැති විය හැකිය.

***වාසි***

- අධිකරණමය විභාගයකින් සමහර ක්‍රියාවන් නොඉවසන බවටත්, විපතට පත් අයට සහන ලබා ගැනීමේ හිමිකමක් පවතින බවටත් ප්‍රබල සංඥාවක් ලබා දේ.
- සාර්ථක නඩු විභාගයක් රජයකට පීඩාව පිළි ගැනීමටත්, හානි පූර්ණය ආරම්භ කිරීමටත් ප්‍රබල සාධකයක් විය හැකිය.
- අනෙක් යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කළත් හානි පූර්ණය කිරීමේ අධිකරණ අයිතිය ඉල්ලා සිටින විපතට පත් වූවන්ට එම විකල්පය තිබිය යුතුය.

## අධිකරණමය නොවන පිවිසුම් : නිදසුන් තුනක්

### 1. එක්සත් ජාතීන්ගේ වන්දි ගෙවීමේ කොමිසම (UNCC)

එක්සත් ජාතීන්ගේ සංවිධානය, එක්සත් ජාතීන්ගේ වන්දි ගෙවීමේ කොමිසම නිර්මාණය කරන ලද්දේ 1990 දී ඉරාකය කුවේට් ආක්‍රමණය කිරීමෙන් සිදු වූ හානියට වන්දි ගෙවීම සඳහාය. අරමුදල් සපයා ගනු ලබන්නේ ඉරාකය අපනයනය කරන තෙල් මත බද්දක් පැනවීමෙනි. හානි පූර්ණය දැඩි ලෙස වන්දි සීමාවකට සීමා කොට ඇත. 2001 ජූලි වන විට ඉදිරිපත් කොට තිබූ ඉල්ලීම් දශ ලක්ෂ 26 කින් වැඩි ප්‍රමාණයක් පරීක්ෂා කොට ඩොලර් කෝටි 3540 ක මුදලක් වන්දි වශයෙන් ගෙවා ඇති අතර ඉතිරි ඉල්ලීම් 10,000 ඩොලර් කෝටි 20,000 කට අධික ප්‍රමාණයක් නියෝජනය කරයි.

එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් පෙනී යන්නේ ප්‍රමාණවත් දේශපාලන උනන්දුවක් ඇත්නම් මහා පරිමාණයෙන් වුව ද ඵලදායි ක්‍රමයක් පවත්වාගෙන යා හැකි බවය. නියමානුකූල රාමුවක් ස්ථාපනය කිරීම, ඉදිරිපත් කිරීමේ ක්‍රියාපටිපාටි පිළිබඳ ප්‍රමිතීන් ඇතුළත් ලේකම් කාර්යාංශයක්, අරමුදල් පිළිබඳ යාන්ත්‍රණයක් කුවාලවීම් සඳහා වන්දි ගෙවීමේ ස්ථාවර පරිමාණයක් හා වන්දි ගෙවීමේ උපරිම සීමාවන් ඊට අයත් විය යුතුය. කෙසේ වුවත් හානි පූර්ණයේ හා සමගි සන්ධානයේ අරමුණ සම්පූර්ණයෙන්ම එකිනෙකට වෙනස්ව පවතී. හානි පූර්ණය

සම්පූර්ණයෙන්ම අතීතයට යොමු වූ තාක්‍ෂණික හා මූල්‍ය මෙහෙයුමක් බවට පත් කොට ඇත.

## 2. සත්‍ය සෙවීමේ කොමිසම

ඵලදායි සත්‍යය සෙවීමේ කොමිසමක කාර්යක්‍ෂම කාර්ය තුළින් කිසියම් පුළුල් ආකාරයක හානි පූර්ණ වැඩසටහන් කරා නිරායාසයෙන්ම යොමු වනු ඇත. සමස්ත හානි පූර්ණ යෝජනාවලියක වැදගත් ලක්‍ෂණ වනුයේ වැරැද්ද ප්‍රසිද්ධියේ පිළි ගැනීම, සමාව ඇයදීම හෝ කනගාටුව ප්‍රකාශ කිරීම, ස්මාරක හා ප්‍රතිශෝධන සඳහා නිර්දේශ යනාදියයි. එහෙත් වන්දි ගෙවීම මූලික ලක්‍ෂණයකි. දකුණු අප්‍රිකාණු සත්‍යය හා සමාදාන කොමිසම අංග පහකින් යුත් ප්‍රතිපත්තියක් නිර්දේශ කළේය.

- අ. හදිසි අන්තර්වාර හානි පූර්ණ ගෙවීම්
- ආ. වසර හයක කාලයක් පුරා පෞද්ගලික හානි පූර්ණ ප්‍රදාන
- ඇ. සංකේතාත්මක නෛතික හා පරිපාලන හානි පූර්ණ පියවර
- ඈ. ප්‍රජා පුනරුත්ථාපන වැඩසටහන්
- ඉ. ආයතනික ප්‍රතිශෝධන

සත්‍යය හා සමගි සන්ධානය වීමේ කොමිසම් පණත යටතේ පෞද්ගලික හාණි පූර්ණ ප්‍රදාන ක්‍රමයන් පරිපාලනය කිරීමට ජනාධිපති අරමුදලක් පිහිටුවීමට ප්‍රතිපාදන ඇත. අරමුදලට දායක වන්නේ ජාතික අය වැය ලේඛණයෙන් දේශීය හා ජාත්‍යන්තර ප්‍රධාන හා අරමුදලේ මුදල් වලින් උපයන පොලියෙනි.

හානි පූර්ණය, සත්‍යය හා යුක්තිය සමග බැඳී සිටිය යුතුය. වන්දි ගෙවීම, සත්‍යය හෙළි කිරීමක් නොමැතිව විපතට පත් පුද්ගලයා නිහඬ කරවීමට යොදා ගන්නේ නම් ඔවුන්ගේ මානසික පුනරුත්ථාපනයට එය බාධාවක් වනු ඇත.

## 3. ජාතික පරිපාලන ආයතන

බොහෝ රටවල් කලින් පාලනය යටතේ විපතට පත් වූවන්ට වන්දි ගෙවීම සඳහා හානි පූර්ණ අරමුදල් හා කොමිසම් සහා ස්ථාපනය කර ඇත. එය සත්‍යය සෙවීමේ කොමිසමක නිර්දේශයක් විය හැකිය. නැතිනම් ස්වාධීනව පිහිටු වූවා විය හැකිය. නිදසුන් වන්නේ,

- 1995 දී බ්‍රසීලය, කලින් පැවති හමුදා පාලනය යටතේ, අතුරුදහන් වූ සන්නද්ධ කැරලි ව්‍යාපාරයක සාමාජිකයන් 135 දෙනෙකුගේ පවුල්වල සාමාජිකයන්ට වන්දි ගෙවීම සඳහා හානි පූර්ණ කොමිසමක් පිහිටු වීය.
- 1991 දී හන්ගේරියානු නීතියකින් රජයෙන් දේපල අත් කර ගැනීමෙන් සිදු වූ හානියට එක වරක් වන්දි ගෙවීම සඳහා හානි ඉල්ලීම් නිරාකරණය කිරීමේ ජාතික කාර්යාලයක් පිහිටුවීය.
- 1991 දී ආර්ජන්ටිනාව, විශේෂයෙන්ම අතුරුදහන් වීම් කෙරේ අවධානය යොමු කර සුවිශේෂ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමෙන් විපතට පත් වූවන්ට වන්දි ගෙවීම සඳහා හානි පූර්ණ නීති සම්මත කර ගත්තේ ය. එය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන්නේ රජයේ මානව අයිතිවාසිකම් කාර්යාලයයි.

# හානි පූර්ණයේ ප්‍රතිලාභීන්

සංගත ක්‍රමයක් යොදා ගන්නේ නම් වෙනත් යුක්තිය හා සමගි සන්ධානය වීමේ යාන්ත්‍රණයන් යටතේ සැළකිල්ලට යොමු වූ විපතට පත් අයට සමාන්තරව ප්‍රතිලාභීන් වර්ගීකරණය සිදු කළ යුතුය. පළමුව හානි පූර්ණය උසාවියක් හෝ සත්‍යය සෙවීමේ කොමිසමක් ඉදිරියේ සාක්ෂි දීම වෙනුවෙන් ලැබෙන තෑග්ගක් සේ නොගත යුතුය. දෙවැනිව, අපරාධ විනිශ්චයට හෝ සත්‍යය සෙවීමේ කොමිසම්වලට විධානයන්ට හෝ මැදිහත් වීමේ වැඩ සටහන්වලට අයත් නොවූ සිද්ධීන්ගෙන් විපතට පත් අයට ද,

සාධාරණ මෙතෙක් ඉටු නොවූ හානි පූර්ණ අවශ්‍යතාවයක් විය හැකිය. හානි පූර්ණ වැඩ සටහන්වලින් ඔවුන් ඉවත් කිරීම නිසා ඔවුන් තුළ කරහක් ද ඇති විය හැකි ය. තුන් වැනිව කරහකාරීත්වයෙන් විපතට පත් වූවන් කෙරේ ද අවධානය යොමු කළ යුතුය. සමහර කාණ්ඩ වලට අයත් විපතට පත් වූවන් අනෙක් අයට වඩා ප්‍රබලව තම දුක් ගැනවිල්ල ඉදිරිපත් කරනු ඇත.

විපතට පත් වූවන් හානි පූර්ණයේ ප්‍රතිලාභීන් ලෙස ලියා පදිංචි කිරීමේදී සත්‍ය සෙවීමේ කොමිසමක් හෝ අධිකරණ පද්ධතියේ සොයා ගැනීම් වැදගත් වුව ද ඊටත් ගැඹුරට යා යුතුය. කුමන තත්ත්වයක් යටතේ වුව ද එය දේශපාලනයෙන් තොර විය යුතු අතර, වෙනස් කොට සැලකීමක් නොවිය යුතුය. වැඩි දුරටත් විපතට පත් සියලු දෙනාගේම හානි පූර්ණය නිර්ණායක සැහෙන මට්ටමකට, පහත් මට්ටමකට පැමිණිය යුතුය.

හානි පූර්ණ වැඩසටහන් වකුව විපතට පත් වූවන් ගැන ද සැලකිල්ලට ගත යුතුය. ඔවුන් වන්දි ලබන්නේ සෘජුවම විපතට පත් වූවන්ගේ පීඩාව සඳහා ද, නැතිනම් ඔවුන්ගේ මානසික පීඩාව හා මූල්‍යමය හානි සඳහා ද යන්නත් වැදගත් වේ. විපතට පත් වූවන්ට සහාය දක්වන කණ්ඩායම්වලට, වකුව විපතට පත් වූවන්ගේ පීඩාව සැනසීම රජයේ යුතුකම බව දක්වෙන තර්ක මානව අයිතිවාසිකමේ නීතියෙන් සොයා ගත හැකිය.

විපතට පත් වූවන් අයත් වන්නේ කුමන කාණ්ඩයකට වුව ද ප්‍රමාණවත් තොරතුරු සැපයීමත්, යථාර්ථවාදී නොවන බලාපොරොත්තු ඇති වීම වැළැක්වීමත් ඉතා වැදගත්ය.

## හානි පූර්ණ පියවර මාලා

ලබා දිය යුත්තේ මුදල් ද සේවාවන් ද නැතිනම් ඒ දෙකේ සංකලනයක් ද යන්න ගැන තීරණයක් ගත යුතුය. සමබර හානි පූර්ණ යෝජනාවලියක් සකස් කිරීමේදී විපතට පත් වූවන්ගේ කැමැත්ත මෙන්ම ඔවුන්ට මූලික සේවාවන් ලබා ගැනීමට බලපාන සියලු ප්‍රායෝගික හා මූල්‍යමය සාධක සැලකිල්ලට ගැනීම වැදගත්ය. විපතට පත් සෑම පුද්ගලයෙකුගේම පීඩාවට ප්‍රමාණවත් මූල්‍යමය වන්දි ගෙවීමක් ඉලක්ක කර ගැනීම යථාර්ථවාදී නොවුවත්, අඩුම ගණනේ කිසියම් වෙනසක් කිරීමට ප්‍රමාණවත් ගෙවීමක් කළ යුතුය. එවැනි ප්‍රදානයන් එක් එක් පුද්ගලයා අනුව තීරණය කිරීමට හෝ හානියේ ප්‍රමාණය අනුව නිශ්චිත මුදලක් දක්වීමට නියමයන් වන්දි ගෙවීමේ ස්ථාවර ක්‍රමයක පදනම මත සැකසිය හැකිය.

සමූහ විපතින් පසුව සම්පූර්ණ හානි පූර්ණයක් ප්‍රමාණවත් නොවන අතර කළ හැකි ද නොවේ. එම නිසා සාමූහික පියවර ද අවශ්‍යය. වඩාත් ඵලදායි වීමට නම් සාමූහික හානි පූර්ණ පියවරක කඩ ඉම අවශ්‍යයෙන්ම අඩු මට්ටමක් විය යුතුය. සාමූහික පියවර, තුළින් විපතට පත් වූවන් විශාල සංඛ්‍යාවකට සෙත සැලසීමේ වාසියක් තිබෙන අතර කිසියම් කණ්ඩායමක් සාමූහිකව විපතට පත් කළ අතීතය සඳහා වඩාත් සුදුසු ප්‍රතිකර්මයකි.

වඩාත් සුදුසු වන්නේ පෞද්ගලික හා සාමූහික පැකිමානයන්ගේ සංකලනයක් ලබා ගැනීමට හැකි වීමය. නිදසුනක් වශයෙන් කලින් පීඩනයට පත් සුළුතර ජන කොටස් සිටින ඈත ප්‍රදේශ වලට වඩා හොඳ, වඩාත් පහසුවෙන් ලබා ගත හැකි සෞඛ්‍යය සේවාවන් සැපයීම සාමූහික වන්දි ගෙවීමේ පියවරක් වශයෙන් ප්‍රයෝජනවත්ය. කෙසේ වෙතත් මෙය මානසිකව ප්‍රකෘතිමත් වීමේ වැඩ පිළිවෙලක් බවට පත්වීම සඳහා එක් එක් පුද්ගලයාට, පෞද්ගලිකවම ලැබෙන දෙයක් විය යුතුය. නිදසුනක් වශයෙන් නොමිලයේ සැපයෙන උපදේශන සේවාවක් විය හැක. පෞද්ගලික හා සාමූහිකවත් මූල්‍යමය හා මූල්‍යමය නොවන වශයෙනුත් අනුස්මරණ හා පුනරාගමන වශයෙනුත් හානි පූර්ණ පියවර සමබර යෝජනාවලියකින් සමන්විත වීම වැදගත්ය.

## හානි පූර්ණය හා අනෙකුත් සංවර්ධන/ මානව දයාවාදී අවශ්‍යතා

ඕනෑම ගැඹුරු හානි පූර්ණ වැඩසටහනක් අය වැය බලපෑම් සහිත වනු ඇත. මේ නිසා ප්‍රමුඛතා තෝරා ගැනීමේ අවශ්‍යතාවක් පවතී. හානි පූර්ණය සහ අනෙකුත් අවශ්‍යතා අතර නිවැරදි තුලනයක් ඇති කර ගැනීම දුෂ්කර කටයුත්තකි.

- අධිකරණ ආයතනයක් ඉදිරියේ හානි පූර්ණ ඉල්ලීමක් ජය ගැනීම, විපතට පත් වූවන් සඳහා වන්දි ගෙවීම රජයේ යුතුකමක් වන හෙයින් එය විපතට පත් වූවන්ට ආධාර කිරීමේ කණ්ඩායම් වලට ශක්තියක් ද වනු ඇත. අධිකරණ තීන්දු අනෙකුත් අවශ්‍යතා නොසලකා ක්‍රියාත්මක කළ යුතුය.
- විපතට පත් වූවන්ට හානි පූර්ණය ලබා දීම සඳහා ඇති වගකීම ප්‍රකාශ කිරීමේ ආකාරයක් වනුයේ එහි සමස්ත ප්‍රතිපත්ති ඉලක්ක විපතට පත් වූවන්ගේ සාමූහික හානි පූර්ණ අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුනරීක්ෂණය කිරීමය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අධිකරණය, සෞඛ්‍යය අධ්‍යාපනය හා නිවාස වැනි අංශ වලට වෙන් කෙරෙන ප්‍රතිපාදන, නිදසුනක් වශයෙන් ආරක්ෂක වියදම් හා ආදායම් බදු අඩු කිරීමට වඩා වැඩි ප්‍රමුඛතාවයක් ගනී. මෙය මහජන දේශපාලන සංවාදයේ කොටසක් විය යුතුය.
- මානව දයාවාදී හා අනෙකුත් හානි පූර්ණ අවශ්‍යතා අතර වෙනස් කොට හඳුනා ගැනීම සඳහා තල දෙකක පිවිසීමක් අවශ්‍යය. රුවන්ඩාව, ජන ඝාතන හා සමූලඝාතන වලින් දිවි ගලවා ගත් අයට ආධාර දීම සඳහා ජාතික අරමුදලක් පිහිටුවීමට අදහස් කර ඇත. ජාතික අරමුදල මානව දයාවාදී ස්වරූපයෙන් යුක්ත වන අතර එය, අධිකරණයෙන් හානි පූර්ණය සඳහා පිළි ගැනීමක් නොමැති වුව ද, ජන ඝාතනවලින් විපතට පත් අය අතුරින් ආර්ථික වශයෙන් වැඩියෙන්ම අසරණ භාවයට පත්ව ඇති කොටස් වල නිවාඩු අධ්‍යාපනය හා සමාජ අන්තර්ග්‍රහණයට ආධාර ලබා දීමට ඉදිරි පත් වේ.

## හානි පූර්ණ වැඩසටහනකට මුදල් ලබා දීම

කලින් පැවති පාලනය යටතේ සිදු කළ අසාධාරණකම්වල වගකීම නව පාලනයට පැවරේ. එසේ වුවත් රාජ්‍ය මූල්‍ය සම්පත් ඉක්මවා යන වෙනත් සුවිශාල දේශපාලන අභියෝගයන් ද තිබිය හැක. එසේනම් හානි පූර්ණය සඳහා අතිරේක අරමුදල් සපයා ගන්නේ කෙසේ ද?

- සිවිල් වගකීම් කලින් සිටි පාලකයින් හා පුද්ගලික වශයෙන් ඒවා සිදු කළ අයට හිමි වනු ඇත. කෙසේ වෙතත් වැරදි කළ අයගෙන් විපතට පත් වූවන්ට හානි පූර්ණය කිරීම සඳහා මුදල් ලබා ගැනීම රජයේ වගකීමකි. එම වැරදි කළ වුන් සිටින විදේශීය රටවල රාජ්‍යන්ට මෙහිදී උදවු කළ හැකිය.
- හානි පූර්ණ බද්දක් ද තුළින් මීට දායක විය හැකිය. එසේ වුවත් එවැනි බද්දක් සැලසුම් කිරීමේදී ඉන් අඩුවෙන්ම පීඩාවට පත් වන අය ගැන සැලකිල්ලක් දක්විය යුත්තේ ඔවුන් මූල්‍යමය වශයෙන් රටින් පළවා හැරීමක් නොවනු සඳහාය.
- හානි පූර්ණ ක්‍රියාවලියක් සැලසුම් කිරීමේදී වගකීම පැවරෙන වක්‍ර වැරදිකරුවන් ද ඇතුළත් කිරීම සැලකිල්ලට ගත යුතු කේන්ද්‍රීය කරුණකි. සමහර වක්‍ර වැරදිකරුවන් වන්නේ අතීතයේ අයථා ප්‍රතිපත්ති වලින් වාසි ලැබූ සමාගම්ය. පැරණි පාලනය යටතේ වූ සමාගම්වල ක්‍රියාකලාපය නිසා ඔවුන්ට පැරණි අයථා කටයුතු සම්බන්ධයෙන් කිසියම් වගකීමක්

හිමිවන්නේ ද? එම නිසාම නීත්‍යානුකූල සම්බන්ධතාවයක් පවතින්නේ ද? තවත් විකල්පයක් වනුයේ වක්‍ර වැරදිකරුවන්ගේ මූල්‍යමය සම්බන්ධතාවය සඳහා ස්වේච්ඡා දායකත්වයක් සැකසීමය.

- වැරදිකරුවන්ගෙන් හා ප්‍රතිලාභීන්ගෙන් පැවත එන්නන් කළින් සිදු කළ වැරදි වෙනුවෙන් විපතට පත් වූවන්ගෙන් පැවත එන පරම්පරාවට වන්දි ගෙවිය යුතු ද? නීතිය අනුව එවැනි ඉල්ලීමක් කළ නොහැකිය. එසේ වුවත් රජයේ නිරන්තර සදාචාරමය හා දේශපාලන යුතුකම වන්නේ සහන සැලසීම නම් ඔවුන්ට ගෙවීමේ ප්‍රතිපත්තියකට යොමුවිය හැකිය. මෙවැනි තත්ත්වයක් යටතේ හානි පූර්ණය සාමූහික ආකාරයක සමාජයීය නැවත බෙදා හැරීමේ ප්‍රතිපත්ති *(social redistribution policies)* හෝ සහනශීලි වැඩසටහනක් *(affirmative action)* වනු ඇත.
- ආසන්න අය වැය දුෂ්කරතාවයන් ලිහිල් කිරීමේ විකල්පයක් වනුයේ වාරික ගෙවීම් හෝ විශ්‍රාම වැටුප් ආකාරයෙන් වන්දි ගෙවීමේ ක්‍රමයකි.
- විදේශීය රාජ්‍යවල දේශපාලනික හා නෛතික වගකීම ගැන කිසියම් ගැටළුවක් නොමැති වුව ද අලුත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යකට නීති මාර්ගයෙන් අනෙකුත් රාජ්‍යන්ගෙන් වන්දි ඉල්ලා සිටීම අතිශයෙන් ගැටළු සහගත තත්ත්වයකි. විදේශීය රටවල දායකත්වය පැහැදිලිවම මුදල් පමණක් විය නොහැකිය. සත්‍යය සෙවීමට ගන්නා ප්‍රයත්නයකදී තුන්වැනි රටවල හෝ පසුගිය පාලනයේ මිතුරන් සපයන තොරතුරු වැදගත් විය හැකිය.

## සේවා සැපයීම (Logistics)

හානි පූර්ණ පිළි ගැනීමේ හා ලබා දීමේ තීරණය සම්ප්‍රදායික අපරාධ අධිකරණයකින් හෝ සත්‍යය සෙවීමේ කොමිසමකින් කළ හැකිය. කෙසේ වුවත් සැබැවටම එය ක්‍රියාත්මක කිරීම වඩාත් හොඳින් කළ හැක්කේ වෙනම හානි පූර්ණ ආයතනයක් මඟිනි. එවැනි ආයතනයක මෙහෙයුම් අවශ්‍යතා සත්‍යය පැවසීම හෝ අපරාධ නඩු පැවරීම සම්බන්ධ ආයතනයක අවශ්‍යතා වලට වඩා හාත්පසින්ම වෙනස්ය.

- සුදුසුකම් ලබන විපතට පත් වූවන් ලේඛණගත කිරීම පළමු අභියෝගයයි. මෙම වැඩ කටයුතු උසාවියක, සත්‍යය සෙවීමේ කොමිසමක යනාදී වශයෙන් වූ ක්‍රියාකරකම් මත පදනම් විය හැක. එහෙත් හානි පූර්ණ වැඩ සටහන එවැනි යාන්ත්‍රණයන්ට සහභාගි නොවූ අයටත් විවෘත විය යුතුය. විපතට පත් වූවන් ලේඛණ ගත කිරීමේදී රට පුරා තොරතුරු ලබා ගැනීමේ ව්‍යාපාර හා පහසු ලියාපදිංචි කිරීමේ යාන්ත්‍රණයන් පැවතීම අවශ්‍ය කාරණයකි.
- හානි පූර්ණ වැඩසටහනේ සීමාවන් පැහැදිලි කිරීමේදී හා විපතට පත් වූවන්ගේ හානි පූර්ණ අවශ්‍යතා ලේඛණගත කිරීමේදි ප්‍රකාශ සටහන් කර ගන්නන් බඳවා ගෙන පුහුණු කළ යුතුය.
- අතීත මර්දනයේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ හානිය සමීක්ෂණය කිරීම හෝ හානියේ මූලික තක්සේරු කිරීමක් සඳහා විපතට පත් අයගේ කට උත්තරය සමග සැසඳීම කාලය ගත වන ක්‍රියාවකි.
- ඉල්ලීම් වල කාර්යාලීය කටයුතු නිම කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් හා පුද්ගලයින් අවශ්‍යය.
- විශේෂයෙන්ම බැංකු ගිණුම් නොමැති අය සඳහා සුදුසු ගෙවීම් ක්‍රියා පටිපාටියක් සකස් කර ගත යුතුය.

# 10 අන්තර් ජාතික ප්‍රජාව : සම්බන්ධ වීමේ නියමයන්

**අන්තර් ජාතික ප්‍රජාව කළ නොහැකි දෙයක් ඉල්ලා සිටිය යුතු නොවේ. අන්තර්ජාතික සහාය තුළ කළ හැකි දේ කුමක් ද යන්න ගැන යථාර්ථවාදී තක්සේරුවක් අඩංගු විය යුතුය.**

සමාදානය ආනයනය කිරීමට හෝ පිටතින් පැටවීමට නොහැකිය. විදේශීය ක්‍රියාකාරීන් සහයෝගය ලබා දී දේශීය ප්‍රතිපත්ති පහසු කරවිය යුතුය. ඒ සඳහා සරල මූල ධර්ම තුනක් අනුගමනය කළ යුතුය.

## ■ පශ්චාත් ගැටුම් පරිවර්තනයේ විශේෂ තත්වයට සංවේදී වීම.

නඩු විභාග සහ සත්‍යය සෙවීමේ කොමිසම් සභා, අන්තර් ජාතික ප්‍රදානක ප්‍රජාව සහ රාජ්‍ය නොවන සංවිධාන අතර වැඩියෙන් ජනප්‍රිය වෙමින් පවතී. බොහෝවිට ප්‍රතිඵලය වන්නේ එවැන්නක් පිහිටුවීම සඳහා නිරායාසයෙන්ම බාහිර බලපෑමක් හා ආධාර ලබා දීමේ දිරි ගැන්වීමක් තිබීම ය. අන්තර් ජාතික ප්‍රජාව එවැනි ගතානුගතික පිවිසුම් අත් හැරිය යුතුය. ප්‍රචණ්ඩත්වයෙන් සාමයට පරිවර්තනය වීම නොවැලැක්විය හැකි සේ සුවිශේෂ කරුණකි. ඊට අමතරව සමගි සන්ධානය වීමේ තත්වයට මුහුණ දීමට ඇති දේශපාලන කැමැත්තේ ශක්තිය සැලකිය යුතු ආකාරයෙන් වෙනස් විය හැකිය. දේශපාලන නායකත්වය තුළත් සිවිල් සමාජයේත් ඇති හැකියාවන් හා සම්පත් ද එවැනිය. එම නිසා අන්තර් ජාතික ප්‍රජාව කළ නොහැකි දෙයක් ඉල්ලා සිටිය යුතු නොවේ. අන්තර් ජාතික සහායට කළ හැකි දේ කුමක් ද යන්න ගැන දේශපාලන, මූල්‍යමය සාමාජයීය වශයෙන් යථාර්ථවාදී තක්සේරුවක් අඩංගු විය යුතුය.

## ■ සමගි සන්ධානය වීමේ ක්‍රියාවලියේ දේශීය හිමිකාරත්වය පිළි ගැනීම.

කල් පවත්නා සාමය දේශීය ප්‍රයත්නයක් විය යුතුය. එකිනෙකා සමග සමගි සන්ධානය විය හැක්කේ විපතට පත් වූවන්ට හා විපත සිදු කළ අයට පමණි. ඉන් අදහස් කෙරෙන්නේ අන්තර් ජාතික ප්‍රජාව පටවනවා වෙනුවට පහසු කිරීම කළ යුතුය. ජනතාව බලාත්මක කළ යුතුය. පශ්චාත් ගැටුම් සමාජය විදේශීය ව්‍යාපෘතීන්වල ගිල්වීමට වඩා (කොසෝවෝ හි සිදු වූවා මෙන්) දේශීය මූල පිරුම්වලට සහයෝගය දිය යුතුය. විශේෂඥයින් ආනයනය කිරීමට වඩා හැකියාවන් ගොඩ නැගීම තෝරා ගත යුතුය යන්නයි. සමාජයක් කොපමණ දුර්වල වුවත් බාහිර සහයෝගයේ අවශ්‍යතාවය කෙතරම් විස්තීරණ හා පුළුල් වුවත් දේශිය හා විදේශීය ආයතන හා රාජ්‍ය නොවන ආයතන වගකීම් හා කාර්යභාරයන් බෙදා ගන්නා මිශ්‍ර ව්‍යාපෘතීන් වඩාත් යෝග්‍යය.

## ■ යථාර්තවාදී කාල රාමුවක් නියම කර ගැනීම

අන්තර් ජාතික සාමය ගොඩ නගන්නන් හා පහසුකම් සලසන්නන් සමගි සන්ධානය සඳහා ඉක්මන් ප්‍රවේශයක් යෝජනා කරනු ඇත. මෙය ඔවුන්ගේම කෙටිකාලීන වුවමනාවන් මත රඳා පවතින්නේ යැයි සහ/හෝ පරිවර්තනයේ සාර්ථකත්වය රඳා පවතින්නේ ජාතික එකමුතුව කරා ඉක්මනින් ළඟා වීමෙන් යැයි පදනම් රහිත හැඟීමක් නිසා විය හැකිය. එය හානිකරය. වේගවත් නොවූ සමගි සන්ධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවීමේ බාධාවක් ලෙස දැකිය හැකි වුවත් එහෙත් ඇත්ත

වශයෙන්ම එහි පැවැත්ම අවශ්‍යම වූ කාරණයකි. ප්‍රමාණවත් කාල රාමුවකට රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ දීර්ඝකාලීන සම්බන්ධතාවයක් පවත්වා ගැනීමත්, පසුගිය අන්තර්ජාතික ව්‍යාපෘතීන් හා මැදිහත්වීම් නිරන්තර ඇගයීමත් අයත් වේ. සමගි සන්ධාන වැඩසටහන් වෙනුවට දේශපාලන හා ආර්ථික ප්‍රතිශෝධනවලට ප්‍රමුඛතාවය ලබා දීමට අන්තර් ජාතික ආයතන යෝජනා කිරීමට සමහර විට බලපෑම් කිරීමට නැඹුරු වේ. එහෙත් අනුචිත දේශපාලන හා ආර්ථික ව්‍යුහයන් ස්ථාපනය කිරීමෙන් දීර්ඝ කාලීන සමගි සන්ධානයට ඇති ඉඩකඩට හානි නොකිරීම ඉතා වැදගත්ය.

## අන්තර් ජාතික සහාය ප්‍රයෝජනවත් විය හැකි ක්ෂේත්‍ර

යුක්තිය යනු අන්තර් ජාතික ප්‍රජාවට (නිශ්චිත කාරණයක් සඳහා පිහිටුවන විනිශ්චය සභා අන්තර් ජාතික අපරාධ අධිකරණය වැනි හා විශ්ව අධිකරණ මූල ධර්ම ක්‍රියාත්මක කිරීම වැනි දේ) සමගි සන්ධානය වීමේ ඉඩක් පවතින ක්‍රියාවලීන්ට සෘජුවම සම්බන්ධ විය හැකි වැදගත් ක්ෂේත්‍රයකි. විදේශීය ආයතන හා රාජ්‍ය නොවන ආයතන ප්‍රමුඛ වන තවත් ක්ෂේත්‍රයක් වන්නේ සත්‍ය පැවසීමය. සමගි සන්ධානය වීමේ ක්‍රියාවලීන්ට සහයෝගය දක්වීම අරමුණු කරගත් වෙනත් ආකාරයන් ඇති කිරීමේ ඉඩ ප්‍රස්ථා සහ/හෝ සුදුසු තත්වයන් නිර්මාණය කිරීම වන්නේ,

- **ඉඩ ප්‍රස්ථා නිර්මාණය කිරීම**, සුව වීම, සත්‍යය සෙවීම, යුක්තිය හා හානි පූර්ණ වැඩසටහන් පිළිබඳ තොරතුරු සහ විශේෂඥතාවය සැළකිය යුතු ආකාරයකින් වැඩි වී ඇත. තොරතුරු ජාල, ගැටුම් නිමාවට පත් වූ රටවල සමගි සන්ධාන වීමේ ක්‍රියාකාරකම් පවත්වාගෙන යන අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන, අධිකරණ විශේෂඥයින්, කොමිසමක වාර්තාවක් පළ කිරීමට සහාය වීම, වන්දි ලබා දීමේ අරමුදලට ආධාර කිරීම, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම යනාදිය ලබා දිය හැකි සම්පත් ය. එහෙත් එවැනි මැදිහත්වීම් හැම විටම ප්‍රදානක රටවල් හා රාජ්‍ය නොවන සංවිධාන අතර සම්බන්ධීකරණයක් පැවතිය යුතුය. නැතිනම් කාර්යක්ෂමතාවය හා බලපෑම අඩු විය හැකිය.

  අතිරේකව අන්තර් ජාතික ප්‍රජාව ප්‍රචණ්ඩ ගැටුමක භෞතික ප්‍රතිඵල පිළිබඳව පූර්ව විනිශ්චයකට එළඹීමේ වරදට හවුල් වී ඇත. ඉන් පෙනී යන්නේ සිවිල් යුද්ධයේ මර්දනයේ ප්‍රතිඵල තුනී කිරීම ප්‍රමුඛතාවය වී ඇති බවය. වැඩි අවධානයක් යොමු විය යුත්තේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳවය.

- **යහපත් තත්වයන් නිර්මාණය කිරීම:** බොහෝවිට අන්තර් ජාතික ප්‍රජාව සිවිල් යුද්ධයක් නතර කිරීමේ ක්‍රියාවලියට හවුල් වේ. ඉන් ඔවුන්ට සාම ගිවිසුම් වලට සමාදානය වීමේ වැඩසටහන් ඇතුළත් කිරීමටත්, සුදුසු දේශීය ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමට උදව් වීමටත් සහ එවැනි වැඩසටහන් හා ව්‍යවස්ථාවන් දේශීයව ක්‍රියාත්මක කිරිමේ වගකීම පැවරෙන සත්‍යය සෙවීමේ කොමිසමේ සාමාජිකයන් වැනි අයට ආරක්ෂාව සැපයීමටත් අවස්ථාවක් ලැබේ. බාහිර ක්‍රියාකාරීන්ට, එදිරිවාදිකම් නැවත පටන් ගැනීමට තර්ජනය කරන කණ්ඩායම්වලට බලපෑම් කළ හැකිය. නඩු විභාග සමගි සන්ධානය වීම

සඳහා තීරණාත්මක වන තැන්හි විදේශීය රටවලට අවශ්‍ය පුද්ගලයින් අදාළ රටවලට ලබා දීම පහසු කරවීමෙන් සහාය විය හැකිය. බහු ජාතික රාජ්‍ය නොවන සංවිධාන වලට සහ රාජ්‍ය ආයතනවලට දේශීය දේශපාලන හා සිවිල් නායකයන්ගේ මූල පිරුම නීත්‍යානුකූල වන හා පදනම් වන අන්තර් ජාතික මග පෙන්වීම් (මුක්තියට එරෙහිව සටන් කිරීමේ එක්සත් ජාතීන්ගේ මග පෙන්වීම්) කෙටුම්පත් කිරීමට සම්බන්ධ විය හැකිය. අන්තර් ජාතික වාර්තාකරණ සහ අධීක්ෂණ යාන්ත්‍රණයන් බෙහෙවින් ප්‍රයෝජනවත්ය. අපරාධ නඩු විභාග වල දී බාහිර ආයතනවලට, සාක්ෂි පරිගණක වල ගබඩා කිරීමෙන් සහාය විය හැකිය. රාජ්‍යයට සාක්ෂි එකතු කිරීම අදාළ වූ විට ඒ සඳහා තමන්ගේම ලේඛණාගාරයක් විවෘත කළ හැකිය.